තරු පලස ළමා සමාජය අඹේපුස්ස

# ළ - තරු

තෛයිමාසික අන්තර්ජාල ළමා සඟරාව

## නිමක් ඉමක් නැති අහසේ පායන තරු

2023 අප්‍රේල් - ජූනි දෙවන කලාපය

## සතුටින් ඉන්න පුතේ...
### ඉගෙනගන්න පුළුවන් එතකොටයි...
පිටුව - 09



## රඟපානවට
### මුළින්ම අම්මා කැමති උනේම නෑ
පිටුව - 07

## මත්ද්‍රව්‍ය රකුසාට නම්
### බිලි වෙන්න එපා
පිටුව - 03

## ආවේගශීලී උනොත්
### අනාගතය අඳුරු වෙන්න පුළුවන්
පිටුව - 05

## අභියෝග දිනන්න තියෙන්න ඕන
### සිතේ ශක්තිය මිසක් ඇගේ ශක්තිය නෙවෙයි
පිටුව - 08

ජායාරූපය
සදුන් චමෝද්‍ය ප්‍රේමරත්න
11 ශ්‍රේණිය
කෑ/වර/විද්‍යාපක්ෂ විද්‍යායතනය, වරකාපොල

# දහම් පිටුව

## වැඩිහිටියන්ගේ අවවාද අපේ ලෝකය සරසන හැටි කියා දෙන

# තිලමුට්ඨි ජාතකය

උපදෙස්
අඹේපුස්ස ශ්‍රී පෝෂිතාරාම බෞද්ධ මධ්‍යස්ථානාධිපති
පූජ්‍ය තියඹරාහේනේ ඥානරතන හිමි

ඔන්න යාළුවනේ එකෝමත් එක කාලෙක විහාරස්ථානයක නිතර කෝපවන භික්ෂුවක් වැඩ වාසය කළා. මේ භික්ෂුව නිතර කෝපවීම ගැන අනෙක් භික්ෂුහු බුදුරජාණන් වහන්සේට පැමිණිලි කළා. එවිට බුදුරජාණන් වහන්සේ උන් වහන්සේගේ අතීත කථාව මෙසේ වදාරා සිටියා.

එකෝමත් එක කාලෙක දඹදිව බරණැස් නුවර බ්‍රහ්ම දත්ත නමින් රජ කෙනෙක් සිටියා. ඒ රජතුමාට පුංචි ලස්සන පුත් කුමාරයෙක් සිටියා. නිසි වයසේදී අධ්‍යාපනය හැදෑරීමට මේ රජතුමා පුත් කුමාරයාව තක්සලා නුවර දිසාපාමොක් ඇදුරුතුමා වෙත පිටත් කළා. දැන් මේ පුංචි කුමාරයා ඇදුරුතුමාගේ යටතේ ශිල්ප හොඳින් ඉගෙන ගන්න පටන් ගත්තා.

දවසක් ඇදුරුතුමා ගෝලයෝ පිරිස සමග දිය නෑමට යාම සඳහා පිටත් වුණා. පිටුපසින්ම ගමන් කළේ මේ පුංචි බ්‍රහ්ම දත්ත කුමාරයා. මෙහෙම යනකොට කුමාරයා දැක්කා වයසක කාන්තාවක් තල වේලනවා. දිය නාලා ආපසු එන විට මේ කුමාරයා තල පැදුරෙන් තල මිටක් අරගෙන කාටත් හොරා කෑවා. මහලු කාන්තාව මේ බව දැක්කත් ඇයට කුමාරයා ගැන දුක හිතිලා නිහඬව සිටියා. ඊළඟ දිනයේත් දිය නෑමට ගොස් එන විට මේ කුමාරයා තල මිටක් අරගෙන හොරෙන් කෑවා. එදත් මේ කාන්තාව දැක්කා පුංචි කුමාරයා තල හොරෙන් කනවා. කිහිප දවසක්ම පුංචි කුමාරයා මේ හොරකම කළා. මහලු කාන්තාව මේ ගැන දිසාපාමොක් ඇදුරුතුමන්ට පැමිණිලි කළා.

ඇදුරුතුමා මේ පුංචි කුමාරයාට තරවටු කරලා දඬුවම් කළා. කුමාරයාට ඇදුරුතුමා ගැන ඇති වුණේ ලොකු තරහක්. ඔහු සිතා ගත්තා කවදාහරි මම මේ ඇදුරුතුමාගෙන් පළි ගන්නවා කියලා.



කාලයක් ගත වුණා. දැන් කුමාරයා සියලු ශිල්ප ශාස්ත්‍ර ප්‍රගුණ කර අවසන්. ඔහු දැන් තරුණ ශක්ති සම්පන්න කුමාරයෙක්. ඔහු තමන්ගේ රාජධානිය බලා ගොස් පිය රජතුමාගෙන් පසුව රජකම භාර ගත්තා. වසර කිහිපයක් ගත වුණා. ඔහුට මතක් වුණා ඇදුරුතුමා ඔහුට දිනක් තල සොරකමට පහර දුන්න බව. රාජපුරුෂයන් ලවා ඔහු ඇදුරුතුමන්ට තමන් හමුවීමට පැමිණෙන ලෙස පණිවිඩ යැව්වා. ඇදුරුතුමා තේරුම් ගත්තා එදා තමන් කළ දඬුවමට වාඩුව ගැනීමට තමයි තමන්ව මේ විදියට ගෙන්න ගන්න හදන්නේ කියලා. රජතුමා වයසින් තරමක් මුකුහුරා යනතෙක් ඇදුරුතුමා ගමන ප්‍රමාද කළා.

කාලයක් ගත වුණා. පණිවිඩ කිහිපයක් ලැබුණු නිසා ඇදුරුතුමා රජතුමා බැහැ දැකීමට රජ මාළිගාවට ගියා. රජතුමා ඇදුරුතුමන්ව දුටු සැණින්ම හිස ගසා මරණයට පත් කිරීමට අණ කළා.

"කුමරුනි අද ඔබ වයසින් මුකුහුරා ගිය උත්තමයෙක්. වෛර නොබඳින්නෙක්. එදා මා ඔබ කළ වරදට දඬුවම් නොකළේ නම් දිගින් දිගටම ඒ වරද කර ඔබ සොරෙකු වනවා නොවනුමානයි. එසේ වූවානම් අද මෙතන රජ පුටුවේ ඔබ නැත. " ඇදුරුතුමා රජතුමාට පැවසුවා.

රජතුමාට ඇදුරුතුමා පිළිබඳ වේදනාවක් ඇති වුණා. ඔහු සිංහාසනයෙන් නැගී සිට ඇදුරුතුමන්ට දණ නමා වැඳ සමාව ඉල්ලා සිටියා. ඉන්පසු ඇදුරුතුමන්ට රජතුමා පුරෝහිත තනතුරක්ද පිරි නැමුවා. නිතර කෝප වන භික්ෂුව එදා බ්‍රහ්ම දත්ත රජ බවත් ඇදුරුතුමා මේ මම වූ බවත් බුදුරජාණන් වහන්සේ දේශනා කළා.

වෛරී සිතුවිලිවලින් අපට අයහපතක් මිස යහපතක් නොවන බවත් වැඩිහිටියන් අපට ලබා දෙන දඬුවම් හා අවවාද අපගේ ජීවිතය යහපත් ලෙස හැඩගස්වා ගැනීමට උපකාර කර ගත යුතු බවත් මේ තිලමුට්ඨි ජාතක කතාවෙන් පැහැදිලි වේ.

කේ. කේ. අමීෂ මිලාන්
10 වසර
කෑ/වර/අඹේපුස්ස මහා විද්‍යාලය

## තෙවැනි ඇස

ඔබ දකින අහඹු හෝ නිතර ඇස ගැටෙන වැඩි අවධානයක් අපගෙන් නොලැබෙන් සුන්දර දසුන් ඡායාරූපයට ගෙන අපට එවන ලෙස අපගේ ඊ - තරු වට්ස්අප් ජාලය හරහා ඔබව දැනුවත් කළෙමු. මේ අපට ලැබුණු එවැනි සුන්දර හා අහඹු දසුන් අතරින් තෝරාගත් තෑගි දිනූ ජයග්‍රාහකයින්ගේ ඡායාරූපයි.

සභාපති (සංජන)




චතුම් රශ්මිත වික්‍රමතිලක
7 ශ්‍රේණිය
කෑ/ ගලිගමුව ම. ම. වි.



ආමන්ත අමරසිංහ
10 ශ්‍රේණිය
කෑ/වර/අඹේපුස්ස ම. වි.



කේ. කේ. අමීෂ් මිලාන්
10 ශ්‍රේණිය
කෑ/වර/අඹේපුස්ස ම. වි.

## මේ ලෝකෙ යහපත් තැනක් කරන්න පුළුවන්.....දුවේ, පුතේ ඔයාලටයි

# වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්

# කෞෂල්‍යා බණ්ඩාර



**රාජ්‍ය සේවාවලින් සේවා සපයන බිම් මට්ටමේ පරිපාලන ඒකකය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යි. මහජනතාවට සේවා සැපයීම මෙන්ම සංවර්ධන කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය එහි වගකීමයි. දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 320 කි. ඒවාට නායකත්වය දෙන ප්‍රාදේශීය ලේකම්වරු තුන්සිය විසි දෙදෙනෙකි. ඒ කාර්යයන්ට සහාය දෙන සහාය ප්‍රාදේශීය ලේකම්වරු තුන්සිය විසි දෙදෙනෙකි. ඇයත් ඒ අතරය. ඒ අපගේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම් කෞෂල්‍යා බණ්ඩාරයි. මේඇයත් සමඟ "e - තරු" අප කළ කතාබහයි.**

## අම්මා තාත්තා ඔයාලා වෙනුවෙන් හුඟක් දුක් විඳිනවා

**සම්පූර්ණ නම ?**

අස්වැල්ලෙ රාළලාගේ චන්ද්‍රානි කෞෂල්‍යා බණ්ඩාර

**පාසල් ගියේ ?**

මම මුලින්ම ගියේ කෑ/ඔත්නාපිටිය කනිෂ්ඨ විද්‍යාලයට. ඒ පාසලෙන් මුලින්ම පහ වසර ශිෂ්‍යත්වය සමත් වුණේ මම. ඉන්පසු තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත් වෙලා උසස් පෙළ දක්වා ඉගෙන ගත්තා.

**උසස් අධ්‍යාපනය ලැබූ විශ්ව විද්‍යාලය මොකක්ද ?**

මම කැලණිය විශ්ව විද්‍යාලයට තේරුණේ කලා විෂයන්ගෙන්. කිසිම අමතර පන්තියකට සහභාගි වෙලා නැහැ. මම කළේ දර්ශනය පිළිබඳ විශේෂවේදී උපාධියක්. දෙවැනි පෙළ ඉහළ සාමාර්ථයක් ලබලා බැජ් එකේ හොඳම ප්‍රතිඵල මට තිබුණු නිසා බාහිර කථිකාචාර්යවරියක් විදියට වසර දෙකක් විශ්වවිද්‍යාලයේ ඉගැන්නුම් කටයුතු කිරීමට අවස්ථාවත් ලැබුණා.

**සහකාර ප්‍රාදේශීය ලේකම්වරියක් දක්වා පැමිණි ගමන් මඟ මතක් කළොත් ?**

මම පරිපාලන සේවා විභාගය ලිව්වා. ලකුණු දෙකක් මදිවුණා. ඊට පස්සේ නේවාසිකාගාර පාලිකා තනතුරට ඉල්ලුම් කළා. අවශ්‍ය සුදුසුකම් තිබුණත් දේශපාලන බලපෑමක් මත අහිමි වුණා. ඊට පස්සේ අධ්‍යාපන පරිපාලන සේවා විභාගය ලියලා එයින් සමත් වුණා. ඒත් දෙවැනි වටයේදී අසමත් වුණා. මහජන බැංකුවේ කළමනාකරණය පිළිබඳ පුහුණුවීම් විභාගය ලියලා සමත් වුණත් දේශපාලන බලපෑම් නිසා ඒ අවස්ථාවත් ගිලිහිලා ගියා. ඒ කාලයේ විදුසර සඟරාවේ විදුහල අතිරේකයට තර්ක ශාස්ත්‍රය පාඩම වසර තුනක් ලිව්වා. 2005 දී කළ උපාධිධාරී බඳවා ගැනීම්වලින් රාජ්‍ය සේවයට එකතු වෙලා මහානාග විද්‍යාලයේ ගුරුවරියක් විදියට සේවය කළා. පසුව කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීම් දෙපාර්තමේන්තුවේ ඇගයීම් සහකාර විදියට වැඩ කළා. 2008 -2013 එල්. ටී. ටී ත්‍රස්ත ප්‍රහාර කාලයේ අම්පාර හාඩි තාක්ෂණික විද්‍යාලයේ සේවය කළේ. ඒ ලබපු අත්දැකීම් මගේ රාජකාරි ජීවිතයේ කවදාවත් අමතක වෙන්නේ නැහැ. ඊටපස්සේ 2015 දී පරිපාලන සේවා විභාගයෙන් සමත්වෙලා පරිපාලන සේවයට එකතු වුණා. පළමුවෙන් බස්නාහිර පළාතට අනුයුක්තව වැඩ කළා. ඉන්පසු රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම් විදියට සේවය කරලා 2018 දී වරකාපොල සහකාර ප්‍රාදේශීය ලේකම් විදියට අද දක්වා වැඩ කරනවා.

## මත්ද්‍රව්‍ය රකුසාට නම් බිලිවෙන්න එපා.....

**පවුලෙ විස්තර ටිකක් කියමුද ?**

මගේ තාත්තා ඒ.ආර්. මුදියන්සේ. ඔහු ගොවිතැන් කළේ. දැන් ජීවතුන් අතර නැහැ. මගේ අම්මා ජී.ආර්. සෝමාවතී. ඇය රැකියාවක් කළේ නැහැ. පවුලේ සහෝදර සහෝදරියන් හතරදෙනයි. බාලයා මම. මගේ සැමියා මහින්ද ප්‍රියදර්ශන. ඔහු ව්‍යාපාරිකයෙක්. දරුවෝ තුන්දෙනෙක් ඉන්නවා. ඒ තුන්දෙනාම පාසල් අධ්‍යාපනය ලබනවා.

**සහකාර ප්‍රාදේශීය ලේකම් ධුරයක කාර්යභාරය මොකක්ද ?**

වරකාපොල කොට්ඨාසයට අයත් වසම් 78 ක් තියෙනවා. ඒවාට අවශ්‍ය පරිපාලන කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදුවෙනවා. රජයේ ඉඩම් ප්‍රශ්න විසඳාදීම, සියලුම වර්ගයේ බලපත්‍ර ලබා දීම, මහ ජනතාවට ආධාර ලබා දීම, දරු දැරියන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලීම, උප්පැන්න මරණ රෙජිස්ටාර් කිරීම, හැඳුනුම්පත් නිකුත් කිරීම වගේම ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන් අධීක්ෂණය කිරීම වැනි කාර්යන් රැසක් සිදුවෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හරහා. ඒ සියලුම කටයුතුවලට ප්‍රාදේශීය ලේකම්වරයාට සහාය දෙමින් සියලුම ළමා හා කාන්තා අධීක්ෂණය තමයි මගේ කාර්ය භාරය.

**ඔබට පාසල් කාලයේ ළමා සමාජයක සාමාජිකාවක් විදියට අත්දැකීම් තිබෙනවද ?**

ඔව්. අපේ ගමේ ළමා සමාජයේ ලේකම්ධුරය දැරුවේ මම. පන්සලේ හාමුදුරුවෝ ගමේ ගුරුවරු, ප්‍රභූන්ගේ උපදෙස් එක්ක අවුරුදු උත්සව, වෙසක් පොසොන් උත්සව, මල් දන්සැල්, පහන්පූජා, භක්ති ගීත හා සල්පිල් සංවිධානය කළා. ඒ දේවල් නිසා වේදිකාවට තිබුණු බය නැතිව ඕනෑම තැනක ගිහින් කතා කරන්න ශක්තියක් ලැබුණා. ළමා සමාජයෙන් ලැබුණු අත්දැකීම මම අද ඉන්න තැනට පිටුවහලක් වුණා කිව්වොත් හරි.

**අද අපේ පාසල්වල සහෝදර සහෝදරියන් අතරත් මත්ද්‍රව්‍ය පැතිරිලා කියලා මාධ්‍යවලින් දකිනවා. මවක් විදියට ඔබ මේ තත්ත්වය දකින්නේ කොහොමද ?**


මම අම්මා කෙනෙක් විදියට මගේ දරුවෝ ගැන හොඳ අවධානයකින් ඉන්නේ. එයාලාගේ පොඩි වෙනසක් වුණත් මට ඒක දැනෙනවා. දරුවෝ ඇසුරු කරන්නේ කවුද කියලා මම සැලකිලිමත්වෙනවා. මගේ දරුවෝ එක්ක මට නිතරම ඉන්න වෙලාවක් නැහැ. දරුවන් අමතර පන්ති යන්නේ එයාලගේ වැඩ කරගන්නේ තනිවම. හොඳ නරක මොකක්ද කියලා තේරුම් කරලා දීලා තියෙනවා. දරුවෝ තේරුම් ගන්න ඕනෑ මවුපියෝ මුදල් හම්බ කරන්නේ මහන්සි වෙලා කියලා. ඒ මුදල් නාස්ති කරන්න හොඳ නැහැ. මවුපියෝ හැමදේම කරන්නේ දරුවෝ වෙනුවෙන්. ඉතිං මට කියන්න තියෙන්නේ රත්තරං දුවේ, පුතේ කවදාවත් මත්ද්‍රව්‍ය වගේ දේකට ඔයාලා යොමුවෙන්න එපා. එහෙම වුණොත් විනාශ වෙන්නේ තමන්ගේ ලස්සන අනාගතේ. මගේ දරුවෝ විතරක් හොඳට හැදුණාට මට වැඩක් නැහැ. හැම දරුවෙක්ම හොඳට හැදුණොත් විතරයි මගේ දරුවන්ගේ අනාගතේ ලස්සන වෙන්නේ. හැම වැඩිහිටි කෙනෙක්ම එහෙම හිතුවොත් මත්ද්‍රව්‍ය සමාජයට විහිළුවක් කරන්න අපට පුළුවන්.

**ඔබේ දරුවන්ගේ විවේක කාලය ගත කරන්න ඔබ ඉඩ දීලා තියෙන්නේ කොහොමද ?**

අපේ ගෙදර ටීවී එකක් නැහැ. පාසල් වැඩවලට විතරක් තුන්දෙනාටම එක දුරකථනයක් තියෙනවා. විවේකයක් ලැබෙන හැම මොහොතකම දරුවෝ කරන්නේ පොත් කියවීමයි.

**ඉදිරි බලාපොරොත්තු මොනවද ?**

පුද්ගලික ජීවිතයේ බලාපොරොත්තුව දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීම. වෘත්තීය ජීවිතයේ බලාපොරොත්තුව මහජනතාවට මීට වඩා හොඳ සේවයක් ලබාදෙමින් ඉහළ තනතුරකට යාමයි.



## ගමේ ළමා සමාජයෙන් මට ලැබුණු අත්දැකීම් අදටත් වටිනවා......

- ජායාරූප -
චතුම් රශ්මිත වික්‍රමතිලක
7 වසර
කෑ/ගලිගමුව ම.ම. විද්‍යාලය

- සටහන -
සංජන කාවින්ද්‍ය වික්‍රමතිලක
9 වසර
කෑ/ගලිගමුව ම.ම. විද්‍යාලය

**"e-තරු" අන්තර්ජාල ළමා සඟරාව,**
**ග්‍රාම නිලධාරී කාර්යාලය,**
**මැටි කර්මාන්ත පාර,**
**අඹේපුස්ස.**
**දුරකථන: 0702368628 (whatsapp)**
**Email : etharumagazine@gmail.com**

**- උපදේශකත්වය -**

අඹේපුස්ස ශ්‍රී පෝෂිතාරාම බෞද්ධ මධ්‍යස්ථානාධිපති

**පූජ්‍ය තියඹරාහේනේ ඥානරතන හිමි**

වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්

**රංගන සජීව**

වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්

**කෞෂල්‍යා බණ්ඩාර**

**- සංස්කාරක/ප්‍රධාන කතෘ -**

**චලානි ධිවන්ති හේරත්**

(සංවර්ධන නිලධාරී, අඹේපුස්ස වසම)

**- විශේෂ සහාය -**

**ඩී. එම්. සී. දිසානායක**

(ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී)

**ඩබ්. ඒ. ආර්. දමයන්ති**

(ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර)

**- සම්බන්ධීකරණ සහාය -**

**අයි. එල්. ගයාත්‍රී ප්‍රියදර්ශනී**

(ග්‍රාම නිලධාරී,අඹේපුස්ස වසම)

**චමිලා හෙට්ටිආරච්චි**

(සංවර්ධන නිලධාරී,අල්ගම වසම)

**ශාලිකා රත්නසේන**

(ආර්ථික සංවර්ධන නිලධාරී, අඹේපුස්ස වසම)

**මොහොමඩ් ෂමිල්**

(සංවර්ධන නිලධාරී, අඹේපුස්ස වසම)

**හර්ෂනී ගුණරත්න**

(සංවර්ධන නිලධාරී, ගණිතපුර වසම)

**- විශේෂාංග කතෘ -**

**සංජන වික්‍රමතිලක** (කෑ/ගලිගමුව ම.ම.වි)

**- ප්‍රවෘත්ති කතෘ -**

**සඳුනි උමංෂා රුවන්සිරි**

(කෑ/වර/ධර්මසිරි සේනානායක ජාතික පාසල)

**- දැන්වීම් හා ප්‍රචාරණ කටයුතු -**

**චතුම් වික්‍රමතිලක** (කෑ/ගලිගමුව ම.ම.වි)

**ඉෂාරා අංජලී** (කෑ/වර/අඹේපුස්ස ම. වි)

**- පරිගණක අක්ෂර හා පිටු සැකසුම -**

**අමිල ග්‍රැෆික්ස්, ගලිගමුව නගරය**

**077 66 98 433**

**- ප්‍රකාශනය -**

වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට අනුබද්ධිත

**අඹේපුස්ස තරු පලස ළමා සමාජය**

## ආදරණීය දුවේ පුතේ
## අලුත් වෙමු .. අලුතින් හිතමු. . .

සිංහල හින්දු අලුත් අවුරුද්ද ගෙවිලා ගිහින් තවම ටික දවසයි. ඒත් තවම ඒ අවුරුදු උණුසුම අපෙන් ඈත් වෙලා නැහැ. අලුත් අවුරුද්දට අලුත් ඇඳුම් පැළඳුම් අරන් අලුත් වුණ අපි පාසලේ අලුත් පන්තියකට යන්නෙත් මේ මාසෙමයි. අලුත් අවුරුද්දේ අලුත් පන්තියක් .ඉතිං ඒ වගේ අපේ ජීවිතෙත් අලුතින් හිතන්න ගොඩක් දේ තියෙනවා.අපි මෙතෙක් කරපු ගොඩක් වැරදි හදාගන්න හොඳම අවස්ථාව තමයි මේ උදා වෙලා තියෙන්නේ. ඉතින් අපි අපේ වැරදි අඩුපාඩු හදාගමු. අලුතින් හිතමු.

අලුතින් හිතන්න නම් නම් ඔයාලා නිතරම කියවන්න ඕනෑ. දැනුම එකතු කරගන්න ජීවිතේ මේ හොඳම කාලයයි. ඔයාලා මේ කාලය අන්තර්ජාලයේ ෆේස්බුක්, ටික්ටොක් වගේ සමාජ ජාලවල සැරිසරමින් කාලය විනාශ කරගන්නේ නැතිව හොඳ සාහිත්‍යය කෘති පරිශීලනය කරන්න. එතකොට තමයි පුංචි ඔයාලට ජීවිතේ ගැන ලස්සනට හිතන්න පුළුවන් වෙන්නේ. ඒ විතරක් නෙවෙයි සූරියකාන්ත මලක් නිතරම සූර්යා දෙසට හැරෙනවා වගේ පොත් පත් නිතරම කියවන ඔයාලාව හොඳ මාර්ගවලටත් යොමු වෙනවා.

ඉතිං දුවේ පුතේ තවත් දෙයක්. දැන් අපි ඉන්නේ ලොකු අර්බුදකාරී වටපිටාවක කියලා පුංචි ඔයාලටත් දැනෙනවා ඇති. ඔයාලගේ මව්පියෝ ඉන්නේ ඇත්තටම ලොකු පීඩනයකින් . මොකද පුංචි ඔයාලට කන්න බොන්න දීලා පාසල් යවලා බලා කියාගන්න ලොකු කැපකිරීමක් කරන්න වෙලා. හැමදේකම මිල දෙගුණ තෙගුණ වෙලා. ඉස්සර පැන්සල් තුනහතරක් ගන්න වියදම අද එක පැන්සලක් ගන්න වියදම් කරන්න වෙලා. ඉස්සර අලුත් අවුරුද්දට ඇඳුම් දෙක තුනක් ගත්තු ඔයාලට මේ අවුරුදදේ ලැබෙන්න ඇත්තේ එක ඇඳුමක් වෙන්න පුළුවන් . ගිය අවුරුද්දේ වගේ නැන්දලා මාමාලාගෙන් ඔයාලට තෑගි නොලැබෙන්න ඇති. කොච්චර අඩුපාඩු තිබුණත් මේ විදියට හරි ඔයාලගේ මව්පියෝ අලුත් අවුරුද්දේ සතුට පුංචි ඔයාලට දෙන්න කොච්චර මහන්සි වෙන්න ඇත්ද? ඒ නිසා පුතේ ඔයාලාගේ මව්පියන් අමාරුවෙන් මහන්සි වෙලා අරන් දෙන පොත් පත්, පෑන් පැන්සල් වගේම ඇඳුම් පැළඳුම් නාස්ති කරන්න එපා. ඔයාලා එයාලාගෙන් අනවශ්‍ය දෑ ඉල්ලලා කරදර කරන්නත් එපා. ඉස්සර රසට කිරි කෝප්පයක් බීලා පාසල් ගිය ඔයාලට අද ඒ රස කිරි කෝප්පය නැතිව ඇති. කමක් නැහැ පුතේ අපි උදේට රස කොළ කැඳ කෝප්පයක් බීලා පාසල් යමු. එහෙම කරනවනම් අම්මලා තාත්තලාගේ ආර්ථිකයට ලොකු සහනයක් වගේම ඔයාලගේ ශරීර සෞඛ්‍යටත් ගොඩක් හොඳයි.

ඔයාලා දන්නවද දුවේ පුතේ දවසක් අපේ ළමා සමාජයේ අඹේපුස්ස මහා විද්‍යාලයේ ඉගෙන ගන්න දරුවෙක් මට කිව්වා පාසලේ අලුතින් "බත් බැංකුවක්" ආරම්භ කළා කියලා. කවදාවත් අහලා නැති බැංකුවක් ගැන ඇහුවාම මාත් පුදුමයට පත් වුණා. බත් බැංකුව කියන්නේ මොකද්ද කියලා දන්නවද? හැම ගුරුවරයෙක්ම තමන් දවල්ට ගේන බත් එකට අමතරව තවත් බත් පාර්සලයක් හෝ දෙකක් ගෙනත් පෙට්ටියකට දානවා. කෑම ගෙනාපු නැති කැමති දරුවෙකුට ඒ පෙට්ටියෙන් කෑම එකක් ගන්න පුළුවන්. පාසලේ ගොඩක් අහිංසක දරුවන්ගේ කුස පිරෙන්නේ ඒ බත් බැංකුවෙන්. බලන්න පුතේ ගුරුවරුන්ටත් ඔයාලාගේ මව්පියන්ගේ අසීරුකම් එයාලටත් දැනෙනවා. මාධ්‍යවල පළ වන ඇතැම් පුවත් ගුරු ගෝලයින් ගැන පුවත් කොතරම් ශෝචනීය වුණත් ගුරුවරු කියන්නෙත් මව්පියන්ට නොදෙවැනි ආදරණීය පිරිසක්. ඔයාලත් ඒ ගුරු මව්පියන්ට මේ අවුරුද්ද පුරාවටත් හැමදාමත් ආදරය ,ලෙන්ගතුකම ,ගෞවරවය ඒ විදියටම ලබා දෙන්න.

ආදරණීය දුවේ පුතේ මේ අලුත් අවුරුද්දේ ඉඳන් ඔයාලගේ මව්පියෝ ඔයාලව පෝෂණය කරනවා වගේ ඔයාලත් ඒ මව්පියන්ව පෝෂණය කරන්න. පුදුම හිතෙනවා නේද? පුංචි ඔයාලා ඒ වගේ ලොකු වැඩක් කරන්නේ කියලා. පුතේ පෝෂණය කරනවා කියන්නේ ඔයාලාගේ මව්පියන්ව ආදරයෙන් ඔයාලව එයාලා බලාගන්නවා වගේ බලාගන්නවට. එයාලා කෑම කන වෙලාවට වතුර වීදුරුවක් එයාලගේ ළඟට ගෙනත් දෙන්න. අම්මා උයන පිහන වෙලාවට කැමැත්තෙන් ගිහින් උදව් කරන්න. පාසල් ඇරිලා ඇවිත් ඔයාලට එළවළු පාත්තියක් දාන්න පුළුවන්. ඉඩ තියෙන හැම තැනකම එළවළු පැළ හිටවන්න පුතේ. ගෙදර ආර්ථිකයටත් ඔයාලට ඒ විදියට දායක වෙන්න පුළුවන්. මොකද ඉස්සරහට තවත් අමාරු කාලයකට අපට මුහුණ දෙන්න සිදු වේවිද දන්නේ නැහැ.

ඉතිං අපි ගොඩක් දේවල් කතා කළා. ඒ වගේම තවත් දෙයක් ඔයාලට කියන්න ඕනෑ.සාර්ථක විදියට අපි මේ පළ කරන්නේ ඊ තරු අන්තර්ජාල සඟරාවේ දෙවැනි කලාපයයි. අපේ මංගල ඊ තරු සඟරාවට ගොඩක් හොඳ ප්‍රතිචාර ඔයාලට ලැබුණා නේද? ගුරුවරුන්ගෙන් වැඩිහිටියන්ගෙන් අපට ලැබුණු අලුත් අදහස් උපදෙස් ඒ විදියටම අපි ආදරයෙන් භාර ගමු. ගිය කලාපයේ අඩුපාඩු හදාගෙන මේ කලාපය පළ කරන්න ඒ උපදෙස් හා අදහස් ගොඩක් වැදගත් වුණා. අපේ නිර්මාණශිලි හැකියාවන් ඔප මට්ටම් කරගන්න ඒ අදහස් ඉදිරියටත් බලාපොරොත්තු වෙමු. ලියන්න කියවන්න කැමැති දරුවෝ බොහෝදෙනෙක් එයාලටත් අවස්ථාවක් ගන්න අපට කතා කළා. ඊළඟ කලාපයට අපි එයාලටත් ලියන්න අවස්ථාවක් ලබා දෙමු. ඉතිං අඹේපුස්ස තරු පලස ළමා සමාජයේ දරුවන්ගේ අදහසින් එළි දැක් වූ ඊතරු අන්තර්ජාල සඟරාවේ තුන්වන කලාපයට වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියලුම දරුවන්ට අපිත් එක්ක එකතු වෙන්න පුළුවන්. එන්න අපිත් එක්ක එකතු වෙන්න. අපට ලියන්න. ඔයාලගේ නිර්මාණශීලි හැකියාවන්ට අවස්ථාව හදලා දෙන්න අපි කැමතියි. අපි ඔක්කොම එකතු වෙලා නිමක් ඉමක් නැති මේ අන්තර්ජාලය අර්ථවත් නිර්මාණශීලි භාවිතයක් කරගනිමු.

**දුවේ පුතේ ලැබුවා වූ නව වසර, ඔබ සැමට සුබ නව වසරක් වේවා...!**

සංස්කාරක
**චලානි හේරත් (සංවර්ධන නිලධාරී)**

# දූලා පුතාලගේ අනාගතය තීරණය කරන්නේ අද ඔයාලා හැසිරෙන විදියයි



**වරකාපොල පොලිසියේ පොලිස් ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක**

## චන්දන ප්‍රසාද්

**ඔබ අද වරකාපොල පොලිස් ස්ථානාධිපති. ඒ දක්වා පැමිණි ගමන් මග සඳහන් කළොත් ?**

මම මුලින්ම පොලිස් සේවයට එකතු වුණේ 1990.08.04 වැනිදා. ඒ උප පොලිස් පරීක්ෂකවරයෙක් විදියට. පසුව පොලිස් පරීක්ෂක ධුරයටත් අද තනතුර වන ප්‍රධාන පොලිස් පරීක්ෂක ධුරයටත් පත් වුණා.

**ඔබගේ පවුලේ විස්තර මොනවද ?**

මගේ ගම ගම්පහ. මගේ පියා උප පොලිස් පරීක්ෂකවරයෙක්. නම චන්ද්‍රජීව. ඔහු ජීවතුන් අතර නැහැ. මගේ අම්මා පද්මිණි. ඇය ගෘහණියක්. මගේ පවුලේ සහෝදරයෝ දෙන්නයි එක් සහෝදරියක් ඉන්නවා. මම විවාහකයි . දුවෙකුයි පුතෙකුයි ඉන්නවා. එයාලා තවම අධ්‍යාපන කටයුතුවල නිරත වෙනවා. මගේ බිරිඳ ගුරුවරියක්. ඇය කොළඹ මියුසියස් විද්‍යාලයේ සේවය කරනවා.

**ඔබ පාසල් ගියේ ?**

බණ්ඩාරවත්ත පරාක්‍රමගම මහා විද්‍යාලයට. වාණිජ අංශයෙන් තමයි මම උසස් පෙළ කළේ.

**පසුගිය දවස්වල අපේ පාසල් සහෝදර සහෝදරියන් අතරටත් මත්ද්‍රව්‍ය එකතු වෙලා කියලා ආරංචි අපි නිතර මාධ්‍යවලින් දැක්කා. මේ ගැන ඔබ මොකද කියන්නේ ?**

පාසල්වල දරුවන්ගේ අධ්‍යාපනයට තර්ජනයක් තමයි මත්ද්‍රව්‍ය. මේවාට ඇබ්බැහි වුණොත් අධ්‍යාපන කටයුතු මඟ හැරෙනවා. වැරදි වැඩවලට පෙළඹෙනවා. තමන්ගේ ඉදිරි අනාගතම අඳුරු වෙනවා. පුතේ අද ඔයාලා හැසිරෙන විදිය අනුව තමයි ඔයාලගේ හෙට දවස තීරණය වෙන්නේ. ඒ නිසා කවදාවත් පුතේ මත්ද්‍රව්‍යය වලට කිසිම දරුවෙක් යොමු වෙන්න එපා. ඒ සම්බන්ධ වැරදි ප්‍රචාර ගෙනියන මිතුරන්ගෙන් සහ වැඩිහිටියන්ගෙන් ඔයාලා වහාම ඈත් වෙන්න.

**ඔයාලා වෙනුවෙන් අපි ඉන්නවා**

**මත්ද්‍රව්‍ය පාලනය කරන්න පොලිසිය මොනවගේ ක්‍රියාමාර්ගද ගන්නේ ?**

අපි මත්ද්‍රව්‍ය වැටලීම් කරනවා. මත්ද්‍රව්‍යවලට යොමු වුණු අයව පුනරුත්ථාපනය කරනවා. මත්ද්‍රව්‍ය ගෙන්වන අයව අධිකරණය ඉදිරියට පමුණුවනවා. විශේෂයෙන් මේ සඳහා යොමු වෙන්නෙ තරුණ පාසල් දරුවන්. අපේ පොලිසිය විසින් පාසල්වල විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් මේ සඳහා දියත් කරනවා.

**අපේ මව්පියන්ට නිතරම අපිත් එක්ක ඉන්න වෙලාවක් නැහැ. අපි පාසල් යන්නේ අමතර පන්ති යන්නේ තනිවම. අපේ වැඩ අපි ගොඩාක් වෙලාවට තනියම කරගන්නේ. එතකොට අපට අපේ ආරක්ෂාව සලසගන්න ඔබ මොනවගේ පණිවිඩයක්ද දෙන්න කැමැති ?**

පුතේ අද ගොඩක් දරුවෝ සම්බන්ධ ගැටළුවලට මූලික හේතුව වෙලා තියෙන්නේ ජංගම දුරකතනය. අද ඔයාලට අධ්‍යාපන කටයුතුවලටත් ජංගම දුරකතනය නැතුවම බැරි වෙලා තියෙනවා. අපට ලැබෙන බොහෝ පැමිණිලි ජංගම දුරකතනය තමන්ගේ පුද්ගලිකත්වය ආරක්ෂා කරගන්නෙ නැතිව භාවිතා කරලා ඇති වුණු ප්‍රශ්න. පුතේ අද ඔයාලා කවුරුවත් විශ්වාස කරන්න එපා. නොපෙන්විය යුතු අඟ පසඟ පෙනෙන විදියේ ඡායාරූප හිතවත් මිතුරෙකුටවත් යවන්න එපා. ඒ වගේම දවසේ වැඩි වෙලාවක් ඔයාලා ඉන්නේ මව්පියෝ එක්ක නැත්නම් ගුරුවරු එක්ක. ඔයාලට මොනවහරි ගැටළුවක් ඇති වුණොත් ඔයාලා අනිවාර්යෙන්ම ගෙදර ගිහින් එයාලට කියන්න ඕනෑ. එහෙම විසඳගන්න බැරි වුණොත් ඔයාලා මව්පියෝ එක්ක අනිවාර්යෙන්ම පොලිසියට එන්න. දරුවෝ හා කාන්තාවෝ වෙනුවෙන්ම වෙනම ළමා හා කාන්තා කාර්යාංශයක් සෑම පොලිසියකම තියෙනවා. විශේෂ පුහුණු කිරීමක් කළ නිලධාරී පිරිසක් තමයි එතන ඔයාලා වෙනුවෙන් සේවය කරන්න ඉන්නේ.

**පුංචි අපට පොලිසිය වචනේ ඇහෙනකොටත් බයක් දැනෙනවා. පොලිසියට එන්නත් බයයි වගේ. ?**

(සිනහ වෙමින්) පුතේ පොලිසියට බය වෙන්න ඕනේ වැරදි වැඩ කරන මිනිස්සු විතරයි. පුංචි ඔයාලා බය වෙන්නේ ඇයි? ඔයාලා වගේම දරුවෝ ඉන්න නැන්දලා මාමලා තමයි මෙතන වැඩ කරන්නේ. එයාලා කරන්නේ මේ රටේ නීතිය හා සාමය ආරක්ෂා කරලා පවත්වාගෙන යන එක. පුංචි ඔයාලට සිද්ධ වෙන ඕනෑම වැරැද්දකට ඔයාලා එන්න පොලිසියට. අපි ගැටළුව විසඳලා දෙන්නම්. එන්න බැරිනම් කතා කරන්න 1929 ට. ඔයාලා අයිති අපේ රටට. හොඳ අධ්‍යාපනයක් ලබලා විනය ගරුක පුද්ගලයෝ හැටියට රටේ නායකත්වය භාර ගන්න ඉන්නේ ඔයාලා. හැම දරුවෙක්ම නායකයෙක්. ඔයාලාගේ ආරක්ෂාව වෙනුවෙන් හැමදාමත් අපි ඉන්නවා පුතේ.

**ඕනෑම කරදරයකදී 1929 ට කතා කරන්න**

**අපි වගේම දරුවෝ ඉන්න පියෙක් විදියට අපට දෙන්න කැමැති අවවාදය මොකක්ද ?**

පුතේ ඔයාලා කවදාවත් ආවේගශීලිව කටයුතු කරන්න එපා. ඔයාලට කවුරුහරි ගැහුවා කියලා හිතන්න. ඔයාලා ආපස්සට රණ්ඩුවට යන්න එපා. ගුරුවරුන්ට කියලා ගැටළුව නිරාකරණය කරගන්න. නැත්නම් පුංචි රණ්ඩුවක් ලොකු අපරාධයක් දක්වා යන්න පුළුවන්. ඔයාලා රටේ පිළිගත් රැකියාවකට යනවනම් විදේශ රටකට යනවනම් රැකියාවක් සඳහා අනිවාර්යෙන්ම පොලිස් සහතිකයක් ගන්න ඕනේ. ඔයාලගේ නම මොකක් හරි ආරවුලකට ගැවිලා තියෙනවනම් අපට ඒ සහතිකයක් දෙන්න විදියක් නැහැ. අපරාධවලට සම්බන්ධ හැම තොරතුරක්ම ජාලගත තොරතුරු පද්ධතියකට ඇතුළත් වෙලා තියෙනවා. කොළඹ අපරාධයක් කරලා වරකාපොලින් ඇවිත් පොලිස් සහතිකයක් ගන්න බැහැ. මොකද ඒ තොරතුරු අපේ තොරතුරු පද්ධතියෙත් තියෙනවා. ඒ නිසා පුතේ අපට ජීවිතේ ගොඩ යන්න තියෙන එකම ක්‍රමය හොඳ අධ්‍යාපනයක් ලැබීම. හොඳ අධ්‍යාපනයක් ලබලා හොඳ රැකියාවක් කරලා සැපවත් ජීවිතයක් ගත කරන්න තියෙන අවස්ථාව ආවේගශීලිව කටයුතු කරලා නැති කරගන්න එපා පුතේ.



- ඡායාරූප -
චතුම් රශ්මිත වික්‍රමතිලක
7 වසර
කෑ/ගලිගමුව ම.ම. විද්‍යාලය

- සටහන -
සංජන කාවින්ද්‍ය වික්‍රමතිලක
9 වසර
කෑ/ගලිගමුව ම.ම. විද්‍යාලය

# ආවේගශීලී වුණොත් අනාගතය අඳුරු වෙන්න පුළුවන්

# කෙටි කතාව



# කීර්ති සර්

"ඈ යකෝ උඹලා හිතන් ඉන්නේ අපි කවුරු කියලද? ගුරු පුටුවට හැට්ටකට්ටක් අඳුවන්න තරම්"

කීර්ති සර්ගේ තරහව පිටවූයේ පන්තිය දෙදරවමින් ගුරු මේසයේ වේවැල දෙකට කැඩී යාමෙනි.

මෙන කවුද ඉතිං අපේ පන්තියේ කවුරු මොන වැරැද්ද කළත් අහුවෙන්නේ මේ මං තමයි. මගේ නම සිතුමි ආදිත්‍යය. යාළුවෝ හැදෑයෝ අහල පහළ අය වගේම ගෙදර අයත් හැමෝම මට කතා කරන්නේ ආදි කියලයි. මට වයස අවුරුදු පහළොවයි. අපේ ඉස්කෝලෙට ඇවිත් "ආදි කවුද " කියා ඇසුවොත් නොදන්න කෙනෙක් නැති තරමට මං හරි ප්‍රසිද්ධයි.

මේ සිද්ධියේදී කීර්ති සර් මගේ කනට කාසියක් තබා මාව ඉහළට ඔසවද්දී මට පෙනුණේ දවල් තරුය. මගේ දෑස්වලින් කඳුළු කඩා හැලුණේ ධාරාණිපාත වැස්සක වැහි බිංදු පොළොවට පතිත වෙනවාක් මෙනි. මේ යකාට හැට්ට කටු තියලා මදි මං මටම කියා ගත්තේ කිසි දිනෙක නොසිඳෙන කෝපයෙනි. එහෙත් මා කිසිදිනෙක අනෙක් අය සමග තරහෙන් පසු නොවෙමි. කොයිතරම් නරක අත්දැකීමක් තිබුණත් කෝපය මගේ හිතේ පවතින්නේ සුළු මොහොතකි. මම සියල්ල අමතක කර විනෝදයෙන් කල් ගෙවන්නෙමි.

සාමාන්‍ය පෙළ විභාගය ආරම්භ වෙන දිනයත් එන්න එන්නම ළං වෙයි. පාඩම් කරන්නත් හිත යොමු කරන්නට බැරිය. ඒ තරම් හිතට අලස බවක් දැනෙයි. කවදත් මං එහෙමය. ඒත් මට නිතරම ඉසුරි ගැන සිතෙයි. ඉසුරි පන්තියේ හැම වාරෙකම පළවැනියාය. ඇය මා සමග කතා කරන්නටවත් කැමැති නැත. මම ඇගේ මුහුණ දෙස බැලුවත් ඇය අහක බලාගන්නේ සර්පයෙකු දුටු ගාණටය.

විභාගයට හරියටම සතියයි.

"ආව්"

හර්ෂ ගලකින් මගේ පිටට ගැහුවේ මට හිතාන්නවත් ඉඩකඩක් නොතබමිණි.

"හැමෝම මටමයි වද දෙන්නේ..... මට උඹලා කවුරුත් පේන්නාන්න බෑ "

මම කෑ ගසමින් හර්ෂට බැණ වැදුණෙමි. ඒ සමගම මම උඹට හොඳ වැඩක් කරන්නම්කෝ කියා සිතා ගත්තෙමි. දවසක් කාටත් හොරෙන්ම හර්ෂගේ වතුර බෝතලය ගෙන පන්තියේ පිටිපස තිබූ පොකුණේ වතුර පුරවා තැබුවෙමි.

එකවරම දුටු දෙයින් මම මවිතයට පත් වෙමි.

"අර අපේ පන්තිභාර ජීවර් වතුර බොන්නේ හර්ෂගේ වතුර බෝතලයෙන් නේද?"

"දෙයියනේ මැඩම් බොන්න එපා. මං පුරවලා තිබ්බේ පන්තියේ පිටිපස්සේ පොකුණේ වතුර"

මං කෑ ගසමින් පවසද්දී මැඩම් වතුර බී අවසන්ය. මටත් වෙන්නේ මේ වගේ වැඩමය. දැන් ඉතිං අදත් පස්ස රත් වෙන්න කීර්ති සර්ගෙන් වදිනවා නොවනුමානයි. හිතූ විදියටම පන්තියේ ළමයින්ගේ හිනා හඬ මැදින මට කීර්ති සර් ඔම පෙරළාගෙනම වේවැලෙන් පහර දුන්නේය. ළමයින්ගේ හිනා හඬ මතක් වෙද්දී කීර්ති සර් ගැන තිබූ කේන්තිය දෙගුණ තෙගුණ විය.

පසුදින උදෑසන කීර්ති සර්ගේ කමිසයෙන් කැරපොත්තෙක් මතු වූයේ මගේ හිතේ තිබූ තරහ ගිනි පුලිඟුවක් සේ මතුවෙන්නා සේය. එදා ඔහු පන්තියෙන් පිටව ගියේ තරහෙන් පැරදිලා මෙන් පරාජිත ස්වරූපයෙනි.

"ඉස්කෝලේ ආවේ නැත්නම් විභාගේ ලියන්න අඩ්මිෂන් එක දෙන්නේ නෑ උඹලට "

උදේ රැස්වීමේ ඔනින එකමයි සර්ගේ වැඩේ...

"ආදිත්‍යය මෙහේ එනවා. තමුසෙට වෙනම නීතියක්ද? කෙල්ලෙක් වගේ එහෙට මෙහෙට ඇඹරෙන්නේ... බලනවා කොණ්ඩේ හැටි. දණ ගහපන් ඇවිත්"

රැස්වීම අවසන් වෙන තෙක් වැල්ලේ දණ ගසා ගෙන සිටි මා හට කීර්ති සර් ගැන ඇත්තේ පුදුම කේන්තියකි.

එදා හවස කීර්ති සර්ගේ බයික් එකේ රෝද දෙකේම හුළං නැත. මට නොනවතාරී කලෙත් කාටවත් හොඳින් ඉන්නට දෙන්නේ නැත.

ඒ අස්සේ ඉස්කෝලෙන් ගෙදරින් ඇත්තේ මට පුදුම වදයකි. පාඩම් කරපන් ඉංගෙන ගනින් අහලටම එපා වෙලාය. කවුරු මොන දේ කීවත් මගේ දවස ගත වූයේ කිසිම තේරුමක් නැතිවය.

"පුතේ ගෙදර බුදු පහන නිවුණා. තාත්තට කරදරයක්ද දන්නේ නැහැ තවම ගෙදර ආවෙත් නැහැ. අම්මා මා සමග අඬමින් පැවසුවාය "

අනේ අම්මට විකාර මං මටම පවසමින් නිදා ගන්නට සැරසුණි. පසුදා පාන්දර වෙනතෙක්ම තාත්තා ගෙදර නොපැමිණි නිසා අම්මා සිටියේ හුල්ලමිනි.

නිවසට ආ දුරකතන ඇමතුමකින් අම්මා මහ හයියෙන් "පුතේ තාත්තා කෝමිච්චියට හැප්පිලා "යැයි කෑ ගසා පවසමින් සිහිසුන්ව ඇද වැටුණි.

අපි රෝහලට යන විටත් කීර්ති සර් එතන සිටිනවා දැක මා පුදුමයට පත් වුණෙමි. මගේ පියා ඉක්මනින්ම රෝහල් ගත කර ඇත්තේ කීර්ති සර් බව අප දැනගත්තේ පසුවය. අම්මා සර්ගේ කකුල් දෙක අල්ලා වැන්දේ දෑස්වල කඳුළු වගුරවමිනි.

තාත්තාගේ තත්ත්වය සෙමෙන් සුව අතට හැරෙමින් පැවතුණත් මගේ පාසල් ගමනත් ටිකෙන් ටික අඩාල වුණා. දැනුණු අසරණකමත් සමග වෙනදාට වඩා පාසල් වැඩවලට මාගේ සිත යොමු විය.

"ආ පුතේ බයාගේ එග්සැම් ඇඩ්මිෂන් එක"

" ඒත් සර් කිව්වා නේද මට විභාගේ ලියන්න දෙන්නේ නැහැ කියලා "

කටකොණින් සිනහා වෙමින් "කිව්වට එහෙම කරන්නේ නැහැනේ.."

පවසමින් කීර්ති සර් මගේ හිස සෙමෙන් අත ගෑවේය.

"පුතේ බයාගේ ඉස්කෝලේ වැඩ ගොඩක් මග ඇරිලා නේද? හෙට ඉඳන් පුතා හවසට මගේ ගෙදර එන්න මට සල්ලි එපා. බයාට මග හැරුණු පාඩම් ටික කියලා දෙන්නම් "

මා කිසිදිනෙක මෙවැනි පරිත්‍යාගයක් බලාපොරොත්තු නොවුණි.

මම සර් ගැන හිතන් හිටපු විදිය සලකපු විදිය කොයිතරම් වැරදිද? සර් පිටතින් සැර පරුෂ විදියට පෙනුණාට ඇතුළතින් කොයිතරම් හොඳ මනුස්සයෙක්ද? මම තනියම කල්පනා කරද්දී හිතට දැනුණේ පුදුම වේදනාවකි.

"සර් නම් සැබෑ දෙවියෙක්" පවසමින් ඔහුගේ දෙපා වැන්දේ සර්ගේ නෙත්වලට ද කඳුළු එක් කරමිනි.

ජේ. පී. ඉදුරංගි නිම්සරා
12 ශ්‍රේණිය
කෑගලු බාලිකා විද්‍යාලය

# රඟපෑමේ දක්ෂයෙක් වෙන්න නම් ඉගෙන ගන්නම ඕනෑ...







## ප්‍රවීණ රංගන ශිල්පිනී

# දුලීකා මාරපන

## ලෝකය දිනන්න ඔයාලට පුළුවන්

ඇය සම්මානනීය රංගන ශිල්පිනියකි...අධ්‍යක්ෂවරියකි...නිෂ්පාදිකාවකි...එපමණක් නොව චිත්‍රශිල්පිනියකි....විශ්ව විද්‍යාල වේදිකාවෙන් රංගනයට පිවිසි ඇය මේ වන විට සිනමාව ටෙලිනාට්‍ය හා වේදිකාවේ තම රංගන හැකියාවන් ඉදිරිපත් කර ඇත. සමනළ හටුවල බට්ටිගේ චරිතයත්, දරුවනේ හි අනුලාගේ චරිතයත්, සූරිය අරණේ සේදිරිස්ගේ බිරිඳගේ චරිතයත් අපට සිනමාවේ අමතක නොවන මතකයන්ය. සඳ අමාවකයි, ජීවිතේ මිත්‍යාව හා නිම කැටයම් ටෙලි නාට්‍යයවල ඇයගේ රංගනය සුවිශේෂිය. ඇයගේ කුඩිඳුල් වේදිකා නාට්‍ය නිෂ්පාදනයත් වන ලෝරන්ස්ගේ මනමාලි වේදිකා නාට්‍යය ඇයගේ දක්ෂතා ප්‍රේක්ෂක හදවත්වල ඉතිරිකළ තවත් අවස්ථාවක්ය.





> "ඉස්කෝලේ මම ජනප්‍රිය වෙලා හිටියේ
> චිත්‍ර අඳින්නයි සිංදු කියන්නයි
> රඟපානවාට මුලින් අම්මා කැමති වුණේ නෑ
> දැන් නම් හරි කැමතියි"

❖ නැන්දා මේ දවස්වල මොකද කරන්නේ ?

මේ දවස්වල ගොඩක් කාර්යබහුල වෙලා ඉන්නේ සූකිරි බටිල්ලෝ කියන වේදිකා නාට්‍යයත් එක්ක. ඒ වගේම ස්වාධීන රූපවාහිනි සේවයේ විකාශය වෙන ටෙලිනාට්‍යක ෂූටින්වලට සහභාගි වෙනවා.

❖ නැන්දා කොහොමද මුලින්ම රංගනයට එකතු වුණේ ?

පුතේ මම මුලින්ම ප්‍රසිද්ධ වේදිකාවක රඟපෑවේ විශ්ව විද්‍යාලයේදී. මගේ යාළුවෙක් රාජ්‍ය නාට්‍ය උළෙලට වේදිකා නාට්‍යයක් කළා. මට ඒ වේදිකා නාට්‍යයෙන් හොඳම නිළියට හිමි සම්මානය ලැබෙනවා. ඒ 1997 වසරේදී. එතැන් ඉඳන් තමයි මගේ රංගන ජීවිතය පටන් ගන්නේ.

❖ රංගනය ගැන නැන්දා මොනවගේ හැදෑරීමක්ද කරලා තියෙන්නේ ?

මගේ පළමු උපාධිය කළේ රංගකලාව පිළිබඳව. ඊට පස්සේ මට එංගලන්ත රජයෙන් ශිෂ්‍යත්වයක් ලැබුණා රංගනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබන්න.
නැන්දට සම්මානයක් ලැබෙද්දී මොනවගේ හැඟීමක්ද දැනෙන්නේ?
ලොකු සතුටක්. අපිව ඇගයීමකට ලක් වෙනකොට පුතේ අපට ලැබෙන්නේ හොඳ උත්තේජනයක්. තවත් අපේ හැකියාවන් ඔපමට්ටම් කරගන්න ඕනේ වගේ හැඟීමක් දැනෙනවා.

❖ මේ වන කොට සම්මාන කොච්චර ලැබිලා තියෙනවද ?

ජාතික මට්ටමේ සම්මාන 9 ක් ලැබිලා තියෙනවා. තව කේරළයේ ජාත්‍යන්තර සම්මාන උළෙලක හොඳම නිළියට නිර්දේශ වෙලා තියෙනවා. ඒ වගේ ජාත්‍යන්තර සම්මාන උළෙලවල්වලට හොඳම නිළියට හිමි සම්මානයට මගේ නම නිර්දේශ වෙලා තියෙනවා.

❖ නැන්දාගේ පාසල මොකක්ද ?

මම වසර කිහිපයක් නුවර හිල්වුඩ් විද්‍යාලයේ ඉගෙන ගත්තා. පස්සේ මම උසස්පෙළ දක්වා ඉගෙන ගත්තේ කෑගල්ල ශාන්ත ජෝෂප් බාලිකා විද්‍යාලයේ.

❖ පාසල් යන කාලෙත් නැන්දා රඟපෑවද ?

අනේ නෑ පුතේ. මම ගොඩක්ම කළේ චිත්‍ර අඳින එක. පාසලේ නාට්‍ය තිබ්බත් ඒ නාට්‍යයවලට ගීත ගායනයෙන් තමයි දායක වුණේ. මොකද අපේ කාලේ නාට්‍ය හා රංගකලාව කියලා විෂයක් තිබුණේ නැහැ. මගේ කටහඬ හොඳයි කියලා ගායනාවලට තමයි එකතු කරගත්තේ. ඒ නිසා මට රඟපාන්න අවස්ථාවක් ලැබිලා නැහැ. දහම් පාසලෙත් එහෙම තමයි මාව ගායනා තරගවලට තමයි තෝරලා යවන්නේ.

❖ නැන්දට කලා කටයුතුවලට මොනවගේ සහයෝගයක්ද ගෙදරින් ලැබුණේ ?

මගේ අම්මා පාසල් ගුරුවරියක්. තාත්තා හමුදා නිලධාරියෙක්. මගේ පවුලේ හැමෝම සම්බන්ධ වෙලා හිටියේ පරිපාලන ක්ෂේත්‍රයට. කවුරුත් කලාවට සම්බන්ධ නැහැ. මම හැදුණේ වැඩුණේ අම්මා එක්ක. එයාගේ ලොකු අකමැත්තක් තිබුණා මම රඟපානවට. මාව විශ්ව විද්‍යාලයේදී ආපහු ගෙදර එක්ක යන්නත් ආවා රඟපානවට එයාගේ තියෙන අකමැත්ත නිසා. බැරිම තැන අම්මා කිව්වා චිත්‍රපටවල ගායනයට විතරක් දායක වෙන්න කියලා. අදනම් හරි කැමැත්තෙන් මම රඟපාන ඒවා බලනවා. මගේ කැමැත්ත තිබුණේ රංගනයට නිසා මම රංගනයට එකතු වුණා මිස ගෙදරින් සහයෝගයක් ලැබුණා කියන්න නම් බෑ.

❖ රංගනයට එන්න කැමැති දරුවෙකුට නැන්දා මොනවගේ උපදේශයක්ද දෙන්න කැමැති ?

පුතේ අපි මොනවා කළත් අපි කරන විෂය හැදෑරීමක් කරලා තමයි පටන් ගන්න ඕනේ. එතකොට තමයි අපට දුර ගමනක් යන්න පුළුවන්. ඒ වගේම රංගනය විශාල පරාසයකට විහිදී යන විෂයක්. හොඳ හැදෑරීමක් සමඟ විනයානුකූලව රංගනයේ යෙදෙනවනම් පුතාලට හොඳ ගමනක් යන්න පුළුවන්. ඒ වගේම පුතේ මම ඔයාලට කියන්න කැමැතියි ඔයාලා මොන දේ කළත් හොඳ මනුෂ්‍යයෙක් වෙන්න. අපි වෛද්‍යවරයෙක් වුණත් නීතිඥයෙක් වුණත් රංගන ශිල්පියෙක් වුණත් මනුෂ්‍යත්වයක් අපි ළඟ නැත්නම් වැඩක් නැහැ. ඒ නිසා මනුෂ්‍යත්වය පිරි රටට වැඩදායක පුද්ගලයෙක් වෙන්න කියලා ඔයාලගේ ළමා සමාජයේ හැමෝටම මම සුබ පැතුවා කියලා කියන්න.

❖ නැන්දගේ ඉදිරි බලාපොරොත්තු මොනවද ?

මගේ ආසාවක් තියෙනවා පුතේ හොඳ සිනමා පටයක් අධ්‍යක්ෂණය කරන්න. අපේ රටේ නම ජාත්‍යන්තරයට ගෙනියන්න පුළුවන් හොඳ නිර්මාණයක් කරන එක තමයි මගේ ඊළඟ බලාපොරොත්තුව.

එල්.ඒ. සඳුනි උමංෂා රුවන්සිරි
11 ශ්‍රේණිය
කෑ/වර/ධර්මසිරි සේනානායක ජාතික පාසල

අභියෝග දිනන්න සිතේ ශක්තිය මිස
ඇඟේ ශක්තිය කුමටදැයි පසක් කළ

# නික් වුජිසික්

ජීවිතයේ අහිමිවීම් ආශිර්වාදයක් කරගන්න



**සාර්ථකත්වය, අපට උපතින්ම කිසිවකු බන්දේසියක තබා තිළිණ කරන්නක් නොව නොපසුබට උත්සහයෙන්, කැපවීමෙන් හා අධිෂ්ඨානයෙන් ළඟා කර ගත යුතු දෙයකි. එයට තමන්ගේ පෙනුම හා අඟහිඟකම් බාධාවක් නොවන බව ඔහු අපට හොඳින් පෙන්වා දෙයි. සියලු සැප සම්පත් තිබියදීත් තමන් තමන්ටම වෛර කරමින් ජීවත් වෙන සමාජයක උපතින් සියල්ල අහිමි වුවත් ඒ සෑම අහිමි වීමක්ම ජීවිතයට ආශිර්වාදයක් කරගත් ඔහුගේ ජීවිත කතාවයි මේ.....**

ඒ උපේක්ෂා සිත්මිණි
10 ශ්‍රේණිය
කෑ/ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය

ඔහු නමින් නිකලස් ජේම්ස් වුජිසික් නොහොත් නික් වුජිසික්ය. නික් 1982 දී ඕස්ට්‍රේලියාවේ මෙල්බන්හිදී උපත ලැබීය. අවාසනාවකට එය සාමාන්‍ය මනුෂ්‍ය උත්පත්තියක් නම් නොවුණි. නික් ඉපදුණේ Tetra Amelia syndrome නම් අතිශය දුර්ලභ ජානමය විකෘතිතාවකට ගොදුරු වෙමිණි. එහි ප්‍රතිඵලයක් ලෙසින් ඔහුට අත්පය කකුල් අහිමි විය මේ නිසාම නික්ගේ ජීවන එතරම් මිහිරි නොවීය.

ඒ කාලයේ පැවැති වික්ටෝරියා ප්‍රාන්ත නීතිය ඔහුගේ අධ්‍යාපනයට හරස් වුයේ ශාරීරික ආබාධිත බව නිසා පාසලකට ඇතුල් විමේ අවස්ථාව වළක්වාලමිනි. කෙසේ වෙතත් කලක් යෑමේදි එම නීතිය වෙනස් වී ප්‍රධාන ධාරාවේ පාසලකට ඒකාබද්ධ වූ පළමු ශාරීරික ආබාධිත පන්තියක සිසුවෙකු වීමට ඔහුට හැකි විය. එහෙත් නික් දෙස අනුකම්පාවෙන් බැලීමට තරම් එකල සමාජය මානුෂීය නොවීය. එපමණක් නොව පාසලේ ඇතැම් නරක සිසුන්ගේ විහිළු තහළු වල ප්‍රධාන ඉලක්කය වූයේ අසරණ අතපය හතර අහිමි වූ නික්ය. මේ නිසාම නික් මානසික අවපීඩනයකට පත් විය. බලාකිසිදු පොරොත්තුක් නොමැතිව ගෙවී ගිය නික්ගේ ආත්මය ගිලගෙන තිබූ අසරණකම සහ හුදකලා හැඟීම අවසානයේ ඔහුව සියදිවි නසාගැනීමට පවා පෙළඹිණි. ඒ වයස අවුරුදු 10 දී නික් නාන තටාකයේ ගිලී සිය දිවි නසා ගැනීමට උත්සාහ කිරීමෙනි. වාසනාවකට ඔහුගේ ජීවිතයට හානියක් නොවුණි.

අවසානයේ ජිවිතයේ නොයෙක් දුක්කම්කටොළු හා වේදනාවන්ට මුහුණ දුන් නික්ට සිය බාධක , අවස්ථා බවට පත් කිරීමට හැකි විස්ම කර්මයක් සොයාගැනීමට හැකි විය. ඔහුගේ මවට "ඔබේ ශරීරයේ ස්වභාවය ඔබේ ජීවිතය දිනන්නට කිසිවිටෙකත් බාධාවක් නොවේ" යනුවෙන් සඳහන් පුවත්පත් ලිපියක් දකින්නට ලැබිණි. එය නික්ගේ ජීවිතයේ හැරවුම් ලක්ෂයක් කිවහොත් ඉතා නිවැරදිය. එතැන් පටන් තමන්ගේ දෑත් දෙපා නොමැතිකම ගැන හදවතින් විඳවපු නික් සාමාන්‍ය මිනිසුන් අතර තමන් සුවිශේෂි චරිතයක් ලෙස සිතන්නට විය. ඔහු ක්‍රමයෙන් අත් පා නොමැතිව පරිපූර්ණ ජීවිතයක් ගත කරන්නේ කෙසේදැයි සොයා ගත්තේය. නික් ඔහුගේ කෙටි පාදයේ තිබූ කුඩා ඇඟිලි දෙකකින් ලිවීමට පුරුදු විය. එසේම පරිගණකය භාවිතා කිරීමට ගෝල්ෆ් පිහිනුම් ඩ්‍රම්ස් වාදනයට මෙන්ම තනිවම ඇඳුම් ඇඳගැනීමටද පුරුදු විය.

අවසානයේ ද්වීතියික පාසලේදි ඔහු ක්වීන්ස්ලන්තයේ මැක්ග්‍රෙගර් ප්‍රාන්තයේ නායකයා ලෙස තේරී පත් විය. වයස 21 වන විට ග්‍රිෆිත් විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ උපාධිය සම්පූර්ණ කළ නික් 2005 දී සිය ලාභ නොලබන ස්වෙච්ඡා සංවිධානය වන "Life without limbs" ආරම්භ කළේය. ඒ වසරේදීම අතපය හතරම ඇති නීරෝගි කෝටි ගාණක ජනගහණයක් අතරින් "වසරේ ඕස්ට්‍රේලියානුවා" ට හිමි සම්මානය නික් විසින් දිනාගනු ලැබුවේ ජීවිතය දිනන්නට අවශ්‍ය වන්නේ සිතේ ශක්තිය මිස ඇඟේ ශක්තිය නොවන බව ලෝකයට පසක් කරමිනි.

2007 දී Attitude is altitude නමින් ආයතනයක් ආරම්භ කළ නික් අද වන විට මානසික වර්ධනය සහ තරුණ ගැටලු පිළිබඳ උපදේශකයෙක් ලෝකප්‍රකට කථිකයෙක්, පුහුණුකරුවෙක් සහ ව්‍යවසයකයකු වට ද පත් වී හමාරය. තමන්ගේ අසාමාන්‍ය සිරුර වාසනාවක් මිස අවාසනාවක් නොවන බව විශ්වාස කළ නික් අද ආදරණීය සැමියෙකු මෙන්ම ආදරණීය පියෙකි.

ජීවිතයේ අහිමිවීම් හමුවේ එදා සිය දිවි නසා ගැනීමට පවා තැත් කළ නික් වුජිසික් ගේ අමිහිරි ජීවිත කතාව අද දහසකුත් මිනිසුන්ගේ ජීවිත අංශක 180 කින් හරවන්නට සමත් බලගතු උත්තේජනයකි. තම අහිමිවීම් අඩුපාඩුකම් සහ අඟහිඟකම් ජීවිතයට ශක්තියක් කර ගනිමින් තම සාර්ථකත්වය කරා ගිය නික් සැබවින්ම විශිෂ්ඨයෙකි. තම අහිමිවීම්, දුක් වේදනා ගැන නොසිතා ජීවිතය දෙස ධනාත්මකව බැලිය හැකි නම් අපට ද කුරිරු දෛවයකට වුවත් අභියෝග කිරීමට හැකි වනු නොඅනුමානයි.






# සතුටින් ඉන්න පුතේ.... ඉගෙනගන්න පුළුවන් වෙන්නේ එතකොටයි.....

## අසිත් මුතුකුමාර

**2018 වසරේ ශ්‍රී ලාංකීය විශිෂ්ටතම ගුරු තරුව ඔහුයි. 2021 වසරේදී ආසියාවේ හොඳම ගුරුවරයාට හිමි සම්මානය ද ග්ලෝබල් එක්සලන්ට් එවොඩ්හි හොඳම ගුරුවරයාට හිමි සම්මානය දිනා ගත්තේ ඔහුයි. 2014 වසරේ මුල්ම ගුරු පත්වීම ලැබ පුත්තලම කල්පිටිය දළුව ශාන්ත අන්තෝනි විද්‍යාලයට යන ඔහු ප්‍රථම වරට සමස්ත ලංකා ජයග්‍රහනයක් පාසලට එම වසරේදීම ගෙන ගෙන දුන්නේය. එතැන් සිට 2019 දක්වා නාට්‍ය අංශයෙන් සමස්ත ලංකා ජයග්‍රහන දිනා දුන් 2020 වසරේ ඔන්ලයින් මොනෝ ඩ්‍රාමා උළලේ දී ප්‍රථම ස්ථානය පාසලට ලබා දීමට ඔහුට හැකි විය. අග්නි කෙටි චිත්‍රපට නිර්මාණය ඔස්සේ ජනාධිපති සම්මානයට ලක් විය. 2022 වසරේ රටවල් 35 ක් අතරින් හොඳම ගුරුවරයාට හිමිවන ග්ලෝබල් එක්සලන්ට් සම්මානයත් දිනා ගත්තේ ඔහුය. ඔහු කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයේ නාට්‍ය හා රංග කලා ගුරු අසිත් මුතුකුමාර ගුරුතුමායි.**

**2022 වසරේ එඩියුකේෂන් අයිකන් සම්මානය හිමි වන්නේ ඔබට. ඒ ගැන ඔබට මොකක්ද කියන්න තියෙන්නේ ?**

මේ මගේ පළවැනි සම්මානය නෙවෙයි. ජාත්‍යයන්තර සම්මානවලින් මාව ඇගයීමට ලක් වෙලා තියෙනවා. ඇත්තටම මේ වගේ ඇගයීම් ලැබෙන කොට ගුරුවරයෙක් විදියට මගේ හිතට ආඩම්බරයක් දැනෙනවා.

**2021 වසරේ ආසියාවේ හොඳම ගුරුවරයාට හිමි සම්මානය ලැබෙන්නෙත් ඔබට ?**

ඔව්. 2018 වසරේ ගුරුතරුව හිමි සම්මානයත් ලැබෙන්නේ මට. මේ හැම ඇගයීමකදීම සලකා බලන්නේ අපි දරුවන්ට ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියේදී යොදාගන්නේ මොනවගේ ක්‍රමෝපායන්ද. එවායෙන් ලබපු ප්‍රගතිය මොනවගේද කියලා. ඉතිං ගුරුවරයෙක් විදියට මම සාර්ථකත්වයක් ලබලා කියලා මට දැනෙනවා පුතේ.

**අදක්ෂ දරුවන්ට පන්ති කාමරයේදී ඔබ මොනවගේ ක්‍රමපෝයන්ද යොදා ගන්නේ ?**

ඇත්තටම අදක්ෂ දරුවෝ කියලා කණ්ඩායමක් නැහැ පුතේ. ඉන්නේ මග හැරුණු දරුවන් කොටසක්. අපි තේරුම් ගන්නේ ඕනෑ මේ දරුවා කවුද කියලා. එයාලට අවශ්‍ය ප්‍රතිකාරය මොකක්ද කියලා. බොහෝ වෙලාවට නාට්‍ය හා රංග කලාවට එන්නේ අනෙක් විෂයන්වලින් ප්‍රතික්ෂේප වුණු දරුවන් . ඔවුන්ට අකුරු ලියන්නවත් බැහැ. මම උගන්වන පාසල තියෙන්නේ මුහුදු වෙරළ ආසන්නයේ. දරුවන්ට මම කියනවා පාසල් ඇරිලා ගෙදර ගිහින් හවස 4 ට විතර ආපහු පාසල එන්න කියලා. හැමෝම පුඩි සයිකල් වලින් මුහුදු වෙරළට යනවා. ගිහින් වැල්ලේ අකුරු ලියනවා. ලියන අකුරු කියවන්න දෙනවා. දරුවන්ට මේක හරි විනෝදයි. තව ටච් ස්කින් සිස්ටම් කියලා ක්‍රමයක් තියෙනවා. ළමයි පෝළිමට තියලා කොන්දේ අකුරු ලියන්න දෙනවා. ඒ ළමයි ස්පර්ෂයෙන් අකුරු අඳුරගන්නවා. ළමයිට හැමදේම පන්ති කාමරය ඇතුළේ කියලා දෙන්න බැහැ. ළමයි කියන්නේ පරිසරයට එකතු පිරිසක්. දරුවෝ සතුටු මනසකින් ඉන්න කොට තමයි උගන්වන්න ඕනෑ. මම ළමයි එක්ක එළවලු කොටුවලට මල් කොටුවලට යනවා. ගිහින් පාඩම් කියලා දෙනවා. මම පාසලට යන කොට අකුරු ලියන්නවත් බැරි දරුවෝ සාමාන්‍ය පෙළ පාස් වුණා. ප්‍රතිඵල මට්ටම සීයයට සීයයි. එක දරුවෙක් හිටියා . එයා වචනයක්වත් කතා කරන්නෙවත් අකුරක් ලියන්නෙවත් නැති කුළෑටි දරුවෙක්. මම එයාව නාට්‍යයකට සම්බන්ධ කර ගත්තා. එයා ටීම් එකත් එක්ක වැඩ කරද්දී වෙනස්ම දරුවෙක් වුණා. සමස්ත ලංකා මට්ටමින් සහය නිළියට හිමි සම්මානයත් දිනා ගත්තා. පාසලේ ශිෂ්‍ය නායිකාවක් වුණා.

**මෙවැනි සම්මාන හා ජයග්‍රහන පිටුපස ඔබට මුහුණදෙන්න සිදු වුණු කරදර බාධක නැද්ද ?**

මොකද නැත්තේ. 2014 වසරේ මගේ මුල්ම පත්වීම ලැබෙන්නේ පුත්තලම කල්පිටිය දළුව ශාන්ත අන්තෝනි විද්‍යාලයට. මම යන්නේ නාට්‍යය හා රංග කලා ගුරුවරයෙක් විදියට. ඒ යන කොට ඒ විෂය ඒ පාසලේ නැහැ. අවම පහසුකම් තියෙන පාසලක්. දරුවොත් හවසට ගෙදර ගිහින් කරන්නේ එළවළු කොටුවල මල් කොටුවල වැඩ කරන එක. නාට්‍යකට පුහුණුවීම් වලට දරුවෝ හවස තියාගන්නවා කියන එක හරිම අසීරු කටයුත්තක්. ළමයි පුහුණුවීම්වලට එන්නේ නැහැ. ඒ වෙලාවට මම ඒ දරුවන්ගේ ගෙවල්වලට යනවා හොයාගෙන. සමහර මව්පියන් දරුවා ගේ ඇතුළේ තියාගෙන නැහැ කියනවා. සමහර මව්පියන් මගේ මුණටම කියලා තියෙනවා ළමයි ඕවට එවන්නේ නැහැ සර් යන්න කියලා. ළමයි කැමැතියි මව්පියන් එන්නේ නැහැ. ඊටපස්සේ 2014 ඉඳන් 2020 ඉඳන් හැම වසරේම සමස්ත ලංකා ජයග්‍රහණ නාට්‍ය අංශයෙන් පාසලට ලැබෙන කොට පාසලේ නම එළියට යද්දේ මව්පියන් දැන් දරුවන්ව බලෙන් නාට්‍යයට එවනවා. අපි පුහුණුවීම් කරන්නේ හවසට. ඒ දවස්වල පාසලේ විදුලි පහසුකම් නැහැ. ඒ වෙලාවට පුහුණුවීම් කරන්නේ දරුවෝ එක්ක යන්න එන මව්පියන්ගේ බයික්වල ලයිට් එළියෙන්. තව මට මතකයි අපට කෙටි චිත්‍රපටයකට මල් වඩම් කිහිපයක් අවශ්‍ය වුණා. අපට ඒ සඳහා මුදල් හොයාගන්න බැරි වුණා. අපි ඒ මල්වඩම් සොයාගත්තේ සොහොනකින්. රෑ වෙලා සොහොනෙන් මල් වඩම් හොයාගෙන එනකොට ළමයි ටිකයි මාවයි පොලිසියෙන් තියාගෙන ප්‍රශ්න කළා.

**ඔබ ගේ ළමා කාලය ගැන කතා කළොත් ?**

මගේ ළමා කාලය නම් එච්චර සුන්දර නැහැ පුතේ. කුරුණෑගල කනෝටුව තමයි මගේ ගම. මම ඉපදුනේ 1988 අවුරුද්දේ. මගේ අම්මා තාත්තා කුලී වැඩ කරලා තමයි මට ඉගැන්නුවේ. අම්මා මට කියනවා මතකයි මම හම්බ වෙලා කිරිදෙන කාලේ ගෙදර කන්න බොන්න දෙයක් නැතිව බඩගින්නට හාල්මැස්සෝ ඔළු වගයක් තම්බලා බීවා කියලා. මගේ ජීවිතේ දුෂ්කරතා ගොඩයි. ආර්ථික අපහසුතා කොන් කිරීම් අපමණයි. මම ගියේ කනෝටුව කණිෂ්ඨ විද්‍යාලයට. මට හිටියේ එක නංගි කෙනෙක්. ඒ නංගිගේ නැති වෙලා මිනිය ගේ ඇතුළේ තියෙන කොට තමයි මම සාමාන්‍ය පෙළ විභාගයට ගියේ. ගොඩක් අය මට විභාගේ ලියන්න එපා කියද්දී මගේ පාසලේ විදුහල්පතිතුමා ඇවිත් මාව විභාගේ ලියන්න පාසලට එක්ක ගියේ. උසස්පෙළ ලියන්න මම කුරුණෑගල මලියදේව විද්‍යාලයට එනවා. ඊටපස්සේ පාසලේ හොඳම දෙවන ප්‍රතිඵල අරගෙන කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රපාලි මණ්ඩපයට එනවා නර්තන උපාධිය හදාරන්න. එතකොට මට කොන්දේ ආබාධයක් ඇවිත් මම නාට්‍යය හා රංග කලාවට මාරුවෙනවා. ඒ ආපු ගමන තමයි මේ අද දවස ගත කරන්නේ පුතේ.

**හෙට දවස ගැන සැලසුම කොහොමද ?**

මම කැමැතියි නාට්‍ය ගැන විදෙස් රටකට ගිහින් ඉගෙන ගෙන විශ්ව විද්‍යාල කථිකාචාර්ය කෙනෙක් විදියට තව දරුවන්ට දැනුම ලබා දෙන්න.

**මෙවැනි සම්මාන ඇගයීම් ජයග්‍රහණ ලබන කොට ගුරුවරයෙක් විදියට ඔබ තවත් අභිප්‍රේරණය වෙන්නේ කොහොමද ?**

පුතේ දරුවෙක් සතුටින් හිටියොත් තමයි හොඳට ඉගෙන ගන්න පුළුවන් ගුරුවරයෙක් සතුටින් හිටියොත් තමයි හොඳට උගන්වන්න පුළුවන්. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ මේ දෙගොල්ලොම සතුටින් ඉන්න ඕනෑ. අද ගුරුවරුන්ට තියෙන ගෞරවය හා සැලකිල්ල ගොඩාක් අඩු වෙලා තියෙන්නේ. ඒ වාගේ කාලෙක මේ වගේ ඇගයීම් ලැබෙන කොට ඇත්තට තව ළමයි එක්ක වැඩ කරන්න ඕනෑ කියලා හිතට දැනෙනවා.



**හැම දරුවෙක්ම දක්ෂයි**





කේ. ඒ . වෙනුරි කාව්‍යා
11 ශ්‍රේණිය "ඒ" - රත්නාවලී බාලිකා විද්‍යාලය

# චිත්‍ර පිටුව





නදුනි ගිහන්සිකා
2 වසර
කෑ/වර/පෝෂිතාරාම ප්‍රාථමික
විද්‍යාලය



ජේ ඒ දම්සර කෙනුල ජයලත්
රෝයල් ජාත්‍යන්තර පාසල



ගිහෙන්සා විහගි ලංකා
සණස පෙර පාසල



එම් එම් අෂිනි නෙතූෂා සංජීව
4 වසර
කෑ/වර/තුල්හිරිය ප්‍රාථමික විද්‍යාලය



මිතුනි සෙනාරා
සණස පෙර පාසල

# තරු නිර්මාණ

## ආදරණීය ගුරුවරු

නොක නොක දුක් ගැහැට
හමුවන මේ දිවිමං තලාවට
ආලෝකයක් වන්නට
විශ්වය පිළිබඳ දෙනෙතින් දකින්නට
ලෝකය වටා සැරිසරමින්
දැනුම පසුපස හඹා යන්නට
මග පෙන්වන්නේ ඔබයි
සිප්හලට පා තබන පුංචි පැටවුන්
සිප් කිරෙන් පෝෂණය කොට
නැණ නුවණ සමගින් ගුණ දම් ද කියා දී
අනාගතය ආලෝකමත් කරන්නට
මහත් වෙහෙසක් දරන ඔබට
වඳිනෙමි හද බැතියෙන්



ඒ. උපේක්ෂා සිත්මිණි
10 වසර
කෑ/ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය

## ඇන්ඩෲ කානගී

ඇන්ඩෲ කානගී ඉතා දිළිඳු පවුලක ජීවත් වූ පුද්ගලයෙක්. කොතරම් දිළිඳු ද කියනවනම් මූලික අවශ්‍යතා සඳහාවත් ඔහුගේ පවුලට මුදල් තිබුණේ නැහැ. කානගී ගේ පියාගේ රැකියාව වුණේ මේස රෙදි මසා නිවෙස්වලට ගොස් විකුණීම. මව කළේ කුළියට රෙදි සේදීම. මේ අය කෑවේ බීවේ දවසේ එක වේලක් වගේ. සමහර දවසට එක වේලක්වත් පිරිමහගන්න ගෙදර කෑම තිබුණේ නැහැ. මේ අඟ හිඟකම් නිසාම කානගී ඉගෙන ගත්තේ වසර 4 ක් විතරයි. ඊට පස්සේ ඔහු නිවෙස්වල මෙහෙකාරකමට ගියා. කුඩා කාලයේ ඔහුට තිබුණේ එක ඇඳුමයි. රෑට ඔහු නිදාගත්තාම තමයි අම්මා ඇඳුම සෝදලා දම්මේ. පුංචි කාලයේ කොයිතරම් කටුක ජීවිතයක් ගත කළත් ඔහු පසුව ලෝකයේ ගොඩාක් ධනවත් පුද්ගලයෙක් වුණා. පුංචියට පටන් ගත්තු ව්‍යාපාරයකින් ලෝකයේ ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක් වෙන්න හැකි වුණා. ඇන්ඩෲ කානගි කියන මේ ධෛර්යවන්ත මිනිසා අද අපි අතර නොසිටියත් සාර්ථක ජීවිතයක් ගත කරන්න උත්සාහ කරන ඕනෑම අයකුට හොඳ ආදර්ශයක්.

ලබන කලාපයෙන් ඇන්ඩෲ කානගී කටුක ජීවිතයෙන් මිදී ධනවත් පුද්ගලයෙක් වූ කතාව බලාපොරොත්තු වන්න.

**ඒ. අභිමානි උත්තරා**
**7 වසර**
**කෑ/ධර්මසිරි සේනානායක මධ්‍ය මහා විද්‍යාලය**

## හෙට දවස



සරන විහඟුන් ගඟන තලයේ විදිය හිරු රැස් නිදහසේ
බමන බඹරුන් ඒ මලේ විදී රොන් සුව නිදහසේ
තුටින දරුවන් තක්සලාවේ කරයි අකුරු ද නිදහසේ
නිතින සතුටින් පිරෙයි ජීවය සුවය පුරවා සැමසිතේ

පිපේවා නිති සැම සිත් තුළ සාමයේ මල් රටාවන්
බැදේවා සිත් තදින් සැමගේ වෙල ආදර ලතාවන්
ලැබේවා රැකවරණ ඔබහට ඉෂ්ඨ දෙවි දේවතාවන්
වැඩේවා ගුණ සැමතැන බෙලෙන ගුණයේ තුනුරුවන්

එල් ඒ සඳුනි උමංෂා රුවන්සිරි
10 වසර
කෑ/වර/ධර්මසිරි සේනානායක මධ්‍ය මහා විද්‍යාලය



# හොඳ ලියන්නෙක් වෙන්න නම් හොඳ කියවන්නෙක් වෙන්න ඕනෑ




ඔහු සම්මානිත නවකතාකරුවෙකි කවියෙකි නාට්‍ය පිටපත් රචකයෙකි ටෙලිනාට්‍ය සහාය අධ්‍යක්ෂවරයෙකි. ඔහුගේ සෙංකොට්ටං කෘතිය නවකතාව 2012 වසරේදී ගොඩගේ සාහිත්‍ය සම්මානය, රාජ්‍ය සාහිත්‍ය සම්මානය හා විද්‍යෝදය සාහිත්‍ය සම්මානය දිනාගනිමින් ස්වර්ණ පුස්තක සම්මානයට නිර්දේශ විය. රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩකවෙල මස්ඉඹුල දුෂ්කර ග්‍රාමයේ උපත ලැබූ ඔහු ළමා කාලයේ විඳි දුක්කම්කටොළු අපමණයි. එය නිර්මාණකරණයට පන්නරයක් කරගත් ඔහු සෙංකොට්ටං, අපොයියාව මණික්කාවත, හිරුත් හිම පියල්ලක හා ඇහි පියන් ඇහැරීලා ආදි විවිධ ආකෘතියේ නිර්මාණ රැසක් පාඨකයින් අතට පත් කෙරීය.

# ප්‍රවීන ලේඛක මහින්ද ප්‍රසාද් මස්ඉඹුල

***මාමේ ඔයා මේ දවස්වල කරන නිර්මාණය මොකක්ද ?***

පුතේ මම අපොයියාව කෘතියෙන් පස්සේ තවම නිර්මාණ කෘතියක් නම් කළේ නැහැ. මම මේ දවස්වල කවිය සම්බන්ධ පර්යේෂණ කරගෙන යනවා. කවි වර්ග විවිධ පළාත්වල තිබුණු සැඟවුණු කවි පිළිබඳ පර්යේෂණ කරලා සන්ථව කවි ටීවී කියන කියන කවි සම්බන්ධ යූටියුබ් නාලිකාවෙන් ඉදිරිපත් කරනවා. කවි ගැන කැමැත්ත දක්වන පුංචි ඔයාලටත් ඔන්න එයින් හොඳ දැනුමක් ගන්න පුළුවන්.

***අපි මාමා ගැන මුලින්ම දැනගත්තේ සෙංකොට්ටං නවකතාවෙන්. ඒ කතාව ලියන්න මාමාට මුලින්ම අදහස ආවේ කොහොමද ?***

මම ඉගෙන ගන්න කාලේ අඩු කුලේ ළමයි පීඩාවට පත් වෙන ආකාරය මම දැක්කා. ඔවුන්ට පාසලේ තිබුණේ ඉතා අඩු සැලකිල්ලක්. පන්තියේ ළමයි අතරත් ඔවුන් ගොඩාක් කොන් වුණා. ඒක මගේ පුංචි සිතට තදින් දැනුණා ඇයි එහෙම කරන්නේ කියලා. ජීව විද්‍යාත්මක කිසිම පදනමක් නැති බොල් දෙයක් නිසා මිනිස්සු පීඩා විඳිනවා කියන අදහස මට තිබුණා. ඇත්තටම අපේ රටේ සමාජ ප්‍රගමනය අඩාල කරන මහා සමාජ බේදවාචකයක් තමයි ඒ පුතේ. ඒ අදහස තමයි මං සෙංකොට්ටං නවකතාවෙන් කියන්න ඕනෑ වුණේ.

***පුංචි අපි නිර්මාණ කරන්න කැමැතියි. ඒත් කරන නිර්මාණය තව අයෙකුට පෙන්නන්න ලැජ්ජයි. මාමා මේ ගැන මොනවගේ උපදෙසක්ද අපට දෙන්න කැමති ?***

ඕනෑම කෙනෙකුට එහෙම හිතෙන්න පුළුවන්. මටත් එහෙම හිතිලා තියෙනවා. මම ඒ වෙලාවට ප්‍රවීණයෙකුට පෙන්නලා ඒ ගැන කතා කරනවා. ඔයාලට ඒ සම්බන්ධ ප්‍රවීණයෝ ළඟ නැති වෙන්න පුළුවන්. මටත් හිටියේ නැහැ. මටත් ප්‍රවීණයෝ හම්බ වුණේ ක්ෂේත්‍රයේ තරමක් දුරට ඉදිරියට ආවට පස්සේ. මම කළේ මගේ නිර්මාණ පත්තරවලට යවන එක. සමහර නිර්මාණ පළ වෙනවා. සමහර ඒවා නැහැ. සාමාන්‍යයෙන් අපට මුහුණු පොතේ ඕනෑම නිර්මාණයක් පළ කරන්න පුළුවන්. ඒත් පත්තරේක බැහැ. සංස්කාරකවරයෙක් තෝර ගත්තු නිර්මාණ විතරයි පළ කරන්නේ. ඒ කාලේ කවියක් පත්තරේක පළ වුණාම මට හරි සතුටුයි. මගේ නිර්මාණය තවකෙනෙක් පිළිගත්තා කියන අදහස මට තිබ්බා. එකෙන් මට තවත් උත්තේජනයක් ලැබුණා. ඔයාලත් ඔයාලගේ නිර්මාණ පත්තරවලට යවන්න. සංස්කාරකවරු ඔයාලව අඳුරන්නේ නැහැනේ. හොඳ නිර්මාණයක් නම් එයාලා අනිවාර්යෙන් පත්තරේ පළ කරනවා.

***පුංචි කතා ලියන අපේ යාළුවෝ ඉන්නවා. එයාලා පොතක් විදියට ඒ නිර්මාණ පළ කරන්න කැමති වුණත් අවස්ථාවක් ඒ අයට නැහැ. මේ ගැන මාමා මොකද හිතන්නේ ?***

පුතේ ඔය ප්‍රශ්නයම මටත් තිබ්බා. ඉස්සර මං පොත් ලියලා පිටපත් පොත් ප්‍රකාශකයින්ට දෙනවා. අන්තිමට මට පිටපතවත් ආපහු ලැබුණේ නැහැ. සෙංකොට්ටං පොත අරගෙන මම බොහෝ පොත් ප්‍රකාශකයෝ ළඟට ගියා. එක්කෙනෙක්වත් පොත ප්‍රකාශයට පත් කරන්න කැමති වුණේ නැහැ. මොකද මම ලේඛකයෙක් විදියට ප්‍රසිද්ධ නැහැ. අන්තිමට සෙංකොට්ටං පොත කතෘ ප්‍රකාශයක් විදියට පත් කළා. මේ වන විට සෙංකොට්ටං හතළිස් හතර වැනි මුද්‍රණයත් කරලා ඉවරයි. කෘතියක් කරන්න අවස්ථාවක් නැහැ කියලා ඔයාලා දුක් වෙන්න එපා. කොයිමොහොතකහරි ඔයාලට අවස්ථාවක් එනවා. ඔයාලා පුළුවන් තරම් කියවන්න. ලියන්න.

***මාමාගේ ළමා කාලේ අත්දැකීම් එක්ක අද ඉන්න තැන ගැන සතුටුයිද ?***

ඔව්. නිර්මාණකරුවෙක් විදියට මට ගොඩක් සතුටුයි අද ඉන්න තැන ගැන. මම ඉපදුණේ රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩකවෙල මස්ඉඹුල කියල පිටිසර ගමක. අපට පොත්පත් ටීවී රේඩියෝ තිබ්බේ නැහැ. කිරි අම්මාගේ කවි තමයි මගේ නිර්මාණ ජීවිතයේ අඩිතාලම. එයා ඇසින් දුටු ලෝකයේ චමත්කාරය තමයි මගේ නිර්මාණවල පදනම. කිරි අම්මා එහෙන් මෙහෙන් ඇහිඳගත්තු කවි ලස්සනට කියනවා. මට මතකයි ටී වී එකක් බලන්න පයින් හැතැම්ම ගාණක් යනවා. එක ගෙදරක තිබ්බා ටීවී එකක්. අපිව ගේ ඇතුළට ගන්නේ නැහැ. බාගේ දොරක් තිබුණේ. එකේ එල්ලිලා ටීවී බලනවා. ඒ ගෙදර මනුස්සයා මම එනවට අකමැත්තේ බාගේ දොරේ උඩ දොර වැහුවා. මගේ අතත් තුවාල වුණා. මං කවදාවත් ආයේ ඒ ගෙදරට ටී.වී බලන්න ගියේ නැහැ. ඊට පස්සේ මමයි කිරි අම්මයි ටීවී එකක් ගන්න පුවක් ඇහින්දා, පොල් අතු විව්වා. කාලයක් යන කොට අපි දෙන්නටම තේරුණා කවදාවත් අපට මෙහෙම කරලා ටීවී එකක් ගන්න බැහැ කියලා. කිරි අම්මා අන්තිමට මට කිව්වේ "කොල්ලෝ උඹ කොළඹ ගිහින් නාට්‍ය කොරලා ටී.වී එකක් ගනින් "කියලා. මගේ බලාපොරොත්තුව කරා මම ගියා. ඒත් මම ටීවී එකේ ඉන්නවා බලන්න වගේම මගේ නාට්‍ය බලන්න මගේ කිරි අම්මා ජීවතුන් අතර නැහැ.

***අද අපි වියුෂන්වලට හිර වෙලා. පරිසරයත් එක්ක යාළුවෝ එක්ක ඉන්න කාලේ අපට ගොඩක් අඩුයි. අපිත් ගොඩක් සමීප දුරකතනයට. මේ නිසා අපේ නිර්මාණශීලි හැකියාවන් මොට වෙලා යාවිද ?***

නැහැ. මම හිතන්නේ අපට වඩා ඔයාලට අවස්ථාව තියෙනවා කියලා. ඉස්සර අපි දෙයක් ගැන සිද්ධියක් ගැන දැනගන්න එතනටම යන්න ඕනේ. අද එහෙම නැහැ. අන්තර්ජාලයේ ඕනෑ තරම් තොරතුරු තියෙනවා. පරිකල්පන හැකියාව තියෙනවනම් අද දරුවන්ට නිර්මාණ කරන්න ගොඩාක් පහසුයි. ඉස්සර අපට තිබ්බේ ජාතික පත්තර විතරයි. අද දරුවන්ට එහෙම නැහැ. ඕනෑනම් පොතක් ලියලා ඊ බුක් එකක් විදියට පළ කරන්න පුළුවන්. ලොකු මුදලක් යන්නේ නැහැ. දැන් ඔයාලට එකතු වෙලා මේ වගේ ඊ පේපර් කරන්න පුළුවන් යාළුවොත් එක්ක එකතු වෙලා. දුරකතනයෙන් කෙටි චිත්‍රපට කරන්න පුළුවන්. කරන හැටි ඕනෑනම් අන්තර්ජාලයෙන්ම හොයා ගන්න පුළුවන්. අද ඔයාලගේ නිර්මාණශීලිත්වය දියුණු කරගන්න හොඳ අවස්ථා තියෙනවා. ඒවාගෙන් හරි විදියට ප්‍රයෝජන ගන්න ඔයාලා බුද්ධිමත් වෙන්න.

***මාමා ගේ කැමතිම පොත සහ කතුවරයා ගැන කිව්වොත් ?***


තනි කතුවරයෙක් සහ පොතක් නැහැ. මම ගොඩක් සාහිත්‍ය කෘති කියවනවා. ගොඩක්ම කැමැති ඉතිහාසය සම්බන්ධ කෘති කියවන්න.

***පවුලේ විස්තර ටිකක් කියමුද මාමේ ?***

මම දැන් ඉන්නේ ගම්පහ ප්‍රදේශයේ මොකද මගේ නිර්මාණ කටයුතුවලට පහසු නිසා. මගේ පවුලේ ඉන්නේ බිරිඳයි, චූටි දුවෙකුයි. එයාට වයස අවුරුදු 6 යි. එයත් මං වගේම කතන්දර ලියනවා. ලොකු වුණාම මට වඩා පොත් ලියනවා කියලා තමයි එයා දැන්නම් කියන්නේ.

***නිර්මාණකරුවෙක් විදියට මාමාට මාමා ගැන ආඩම්බරයිද ?***

තනි පුද්ගලයෙක් විදියට මට මං ගැන ආඩම්බරයි. ඒත් පුතේ කවදාවත් නිර්මාණකරුවෙක් ආඩම්බරයට පත් වෙන්න හොඳ නැහැ. ඒ වගේම සෑහීමකට පත් වෙන්නත් හොඳ නැහැ. මොකද නිර්මාණකරුවෙක් නිතරම ගවේෂණය කරන්න. මහන්සි වෙලා කියවන්න ඕනෑ. නිර්මාණ කරන්න ඕනෑ. අපූරු නිර්මාණ බිහි වෙන්නේ එතකොටයි.



**ආමන්ත අමරසිංහ**
**10 වසර**
**කෑ/වර/ අබේපුස්ස මහා විද්‍යාලය**

# චිත්‍ර කතාව






## පසුගිය කලාපයේ පල වූ ප්‍රහේලිකාව නිවැරදිව පුරවා අපට එවා වටිනා පොත් කට්ටලයක් දිනූ ජයග්‍රාහකයා

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. ක | ත | 2. ර | ග | ම | | 3. ව | න් | 4. දි | ය |
| ති | | ත් | | | 5. ග | | | නි | |
| 6. ර | බා | න | | 7. දෙ | ව | න | 8. පෑ | ති | 9. ස් |
| ය | | පු | | | ගා | | ල | | ක |
| | 10. ම | ර | ක් | 11. ක | ල | | දො | | න් |
| 12. පි | හි | ය | | ර | | 13. තී | ර | | ධ |
| | ය | | 14. ක | ද | | රි | | 15. ක | ය |
| 16. අ | ං | | | 17. ර | ඹු | ක් | ක | න | |
| | ග | | 18. අ | | | ක | | 19. ක | 20. ස |
| 21. ග | ණ | දෙ | වි | | 22. ජ | ල | ය | | ම |

ආමන්ත අමරසිංහ
10 වසර
කෑ/වර/අඹේපුස්ස මහා විද්‍යාලය

## චිත්‍ර පිටුවේ ඉතිරි ටික



කේ කේ අම්ෂ මිලාන්
10 වසර
කෑ/වර/අඹේපුස්ස ම ම වි



එල් තරුෂි සිත්මා විදුමිණ
1 වසර
කෑ/වර/තුල්හිරිය ප්‍රාථමික විදුහල




දැහැමි ලෙහන්සා පායාදි
3 වසර
කෑ/වර/පෝෂිතාරාම ම ම වි



කේ කේ අම්ෂ මිලාන්
10 වසර
කෑ/වර/අඹේපුස්ස ම ම වි



එම් ඒ රවීෂ් ධිවාන් සුලක්ෂණ ජයතිස්ස
පුංචි කැකුළු පෙර පාසල



තේෂාන් තෙව්සස් සමරකෝන්
විශේෂ අධ්‍යාපන ඒකකය
කෑ/ඩඩ්ලි සේනානායක ම ම වි



සිතුක නිසලිත
සණස පෙර පාසල



එම් ඒ පවන් සුලක්ෂණ ජයතිස්ස
6 වසර
කෑ/වර/ධර්මසිරි සේනානායක ජාතික පාසල

# ගමේ විත්ති

## පෝෂිතාරාම විදුහලේ සහෝදර සහෝදරියන්ට සමබර ප්‍රණීත ආහාර වේලක්



අපේ ගමේ පෝෂිතාරාම විදුහලේ පුංචි අපේ සහෝදර සහෝදරියන්ට වරකාපොල ප්‍රාදේශීය ලේකම් තුමාගේ මූලිකත්වයෙන් මාස දෙකකට ආසන්න කාලයක් දිවා ආහාරය ලබා දුණි. පවතින ආර්ථික අර්බුද හමුවේ සමබර ආහාර වේලක් දරුවන්ට ලබා දීම මෙම වැඩසටහනේ මූලික අරමුණ විය.

එම්. ආර්. ඉමේෂා අංජලී
11 වසර
කෑ/වර/අඹේපුස්ස මහා විද්‍යාලය

## අපේ ගමට විශේෂ වෛද්‍ය වැඩසටහනක්



එම්. ආර්. දුලාංජලී සෞභාග්‍යා මහගම
8 වසර
කෑ/වර/ ධර්මසිරි සේනානායක ජාතික පාසල

අපේ ගමේ ග්‍රාම සංවර්ධන සමිතියේ නැන්දලා මාමලා මූලිකත්වයෙන් විශේෂ වෛද්‍ය වැඩසටහනක් අඹේපුස්ස පෝෂිතාරාම විහාරස්ථානයේදී පැවැත්විණි. වරකාපොල මූලික රෝහලේ කාර්යමණ්ඩලයේ නැන්දලා මාමාලා ඒ සඳහා දායකත්වය දුන් අතර අපේ ගමේ විශාල පිරිසක් එදින රුධිර පීඩන පරීක්ෂාවක් කොලෙස්ට්‍රෝල් පරීක්ෂාවක් ඇතුලු දියවැඩියා පරීක්ෂණය සිදු කරනු ලැබිණි.

## පෙර පාසල් ගුරු මාපියන්ට උපහාර උළෙලක්

සංජන කාවින්ද්‍ය වික්‍රමතිලක
9 වසර
කෑ/ගලිගමුව ම. ම .වි

වරකාපොල කොට්ඨාසයේ පෙර පාසල් ගුරුවරුන්ට උපහාර උළෙලක් පසුගියදා වරකාපොල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදී ලංකා බැංකුවේ පූර්ණ අනුග්‍රහයෙන් පැවැත්විණි. එදින පෙරපාසල් ගුරුවරුන්ගේ නර්තන ප්‍රසංගයක්ද පැවැත්විණි. එහිදී උපහාර ලබා දෙනු ලැබුවේ වසර 30 කට වැඩි කාලයක් පෙර පාසල් සේවයේ සිටි ගුරු මව්වරුන්ට උපහාර ලබා දීම සිදු වුණි.



## ග්‍රාම සංවර්ධන සමිතියේ නැන්දලා මාමලාගෙන් වර්ණවත් සල්පිලක්



අපේ ගමේ ග්‍රාම සංවර්ධන සමිතිය මගින් පසුගියදා සල්පිලක් සහ විවිධ ප්‍රසංගයක් හිතමිතුරු ක්‍රීඩාංගනයේදී වර්ණවත් අන්දමින් පැවැත්වීය. රාජ්‍ය නැටුම් කණ්ඩායමේ නර්තන මෙන්ම අපේ ගමේ සහෝදර සහෝදරියන්ගේ නර්තනවලින් සල්පිල ආලෝකමත් වීම විශේෂත්වයක් විය.

චතුම් රශ්මිත වික්‍රමතිලක
7 වසර
කෑ/ගලිගමුව ම. ම. වි

## පෙර පාසල් සහෝදර සහෝදරියන්ගේ මව්පියන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක්

පෙර පාසල් සහෝදර සහෝදරියන්ගේ මව්පියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නැන්දලා මාමලාගේ මූලිකත්වයෙන් පසුගියදා ගණිතපුර මලර් මදි පෙරපාසලේදී පැවැත්විණි. එහිදී මුල් ළමා වියේ දරුවන්ගේ සංවර්ධනය සඳහා නිවසේ පරිසරය හා සම්පත් ඵලදායීව යොදා ගත හැකි ආකාරය පිළිබඳව මව්පියන් දැනුවත් කිරීම සිදු කෙරුණි.



එම්. ආර්. ඉමේෂා අංජලී
11 වසර
කෑ/වර/අඹේපුස්ස මහා විද්‍යාලය

## නොමිලේ පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහනක්



අඹේපුස්ස වසමෙ අඩුආදායම්ලාභී පවුල් 28 කට නොමිලේ පාසල් උපකරණ බෙදා දීම වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පෝෂිතාරාම විහාරස්ථානයේදී සිදු කෙරීය. ඒ සඳහා මුදල් දායකත්වය ගමේ ව්‍යාපාරික මාමාලා නැන්දලාගෙන් ලැබිණි.

එම්. ආර්. දුලාංජලී සෞභාග්‍යා මහගම
8 වසර
කෑ/වර/ ධර්මසිරි සේනානායක ජාතික පාසල